# ALL NATIONS GOSPEL PUBLISHERS



Copyright ANGP

[www.angp-hb.co.za](http://www.angp-hb.co.za)

[info@angp.co.za](mailto:info@angp.co.za)

*SINHALA Heart Book*

# මිනිසාගේ සිත

## හෝ

## සිත නැමති ආත්මික කැඩපත

**(පිළිවෙලින් යුත් චිත්‍ර දහයකින් සමන්විතයි)**

Copyright ANGP

මෙම පොත මෙහි පින්තූරු සමග 1732 දී ප්‍රංසයෙන් උත්පාද විය. මෙය "සිත නැමති ආත්මික කැඩපත" හෝ "සිත නැමති පොත" යනුවෙන් හැඳින්වේ. ශුද්ධ ලියවිල්ලේ මෙන් මෙහි ඇති ඉතා ගැඹුරු සත්‍යමය වටිනාකම නිසා, මෙය සෑම යුරෝපීය භාෂාවකින්ද, බොහෝ අප්‍රිකානු භාෂාවලින්ද, එද මෙන් අද ද බෙදහරියි. තවද, මෙය සෑම පංතිවල හා තරාතිරමවල අය විසින් කියවනු ලැබේ.

පරණ ගිවිසුමේ ඇති දෙවියන්වහන්සේගේ සත්‍යයය අළුත් ගිවිසුමේදී සම්පූර්ණ වූ සැටි අද බොහෝ දෙනෙක් අත්හද බලා ඇත. "මම අළුත් සිතක් තුඹලාට දී, අළුත් ආත්මයක් තුඹලා තුළ තබන්නෙමි."

(එසකියෙල් 36:26; හෙබ්‍රෙව 8:10)

ජේ. ආර්. ෂුවෙන්ඩ

**COPYRIGHT**
ISBN 0 - 908412 - 35 - 5

E-MAIL: info@angp.co.za
**ALL NATIONS GOSPEL PUBLISHERS**
P.O. Box 2191, PRETORIA, 0001, R.S.A.
(A Gospel Literature Mission financed by donations)
(Reg. No. 1961/001798/08)

පව් කරන සෑමදෙනම නොපනත්කමද කරති. පාපය නම් නොපනත්කමය.

පව් දුරු කරන පිණිස උන්වහන්සේ ප්‍රකාශ කරනු ලැබූ බව තුඹලා දන්නහුය. කිසි පාපයක්ද උන්වහන්සේ තුළ නැත.

යමෙක් උන්වහන්සේ තුළ පවතීද, ඔහු පව් කරන්නේ නැත. පව් කරන තැනැත්තා උන්වහන්සේ දුටුවේවත් උන්වහන්සේ ඇඳින ගත්තේවත් නැත.

මාගේ ප්‍රිය දරුවනි, තුඹලා මුලාකරන්ට කිසිවෙකුට ඉඩ නොදෙන්න. උන්වහන්සේ ධර්මිෂ්ඨව සිටින්නාක් මෙන් ධර්මිෂ්ඨ-කම් කරන්නා ධර්මිෂ්ඨව සිටියි.

පව් කරන තැනැත්තා යක්ෂයාගෙන්ය; මක්නිසාද යක්ෂයා පටන්ගැන්මේ සිට පව් කරන්නේය. දෙවියන්වහන්සේගේ පුත්‍රයා-ණන් ප්‍රකාශ කරනු ලැබුවේ මේ පිණිසය, එනම්: යක්ෂයාගේ ක්‍රියා විනාශ කරනු පිණිසය.

දෙවියන්වහන්සේගෙන් ඉපදී සිටින කිසිවෙක් පව් කරන්නේ නැත; මක්නිසාද, ඔහු තුළ උන්වහන්සේගේ බීජය පවතින්නේය. දෙවියන්වහන්සේගෙන් ඉපදී සිටින බැවින් පව් කරන්ට ඔහුට නුපුළුවන.

මෙයින් දෙවියන්වහන්සේගේ දරුවෝද, යක්ෂයාගේ දරුවෝද ප්‍රකාශව සිටිති. ධර්මිෂ්ඨකම් නොකරන්නෙක්වත්, තම සහෝදර යාට ප්‍රේම නොකරන්නෙක්වත් දෙවියන්වහන්සේගෙන් නොවෙයි.

(1 යොහන් 3:4—10)

Copyright ANCP

# මිනිසාගේ සිත

## දෙවියන්වහන්සේගේ මාළිගාවද නැතහොත් යක්ෂයාගේ වැඩ පොළද

**1 යොහන් 3:4—10**

**මෙම පොත ඔබව නිරූපනය කරන කැඩපතක් බව සිතෙහි තබාගන්න. ඔබ ක්‍රිස්තුභක්තිකයෙකු හෝ පසුබටවූවකු හෝ නොඇදහිලිවන්තයකු හෝ බෞද්ධයකු හෝ වෙනත් ආගමකට හෝ ධර්මයකට අයත් වූවෙකු හෝ වුවද, දෙවියන්වහන්සේට ඔබව පෙනෙන පරිදි මෙම පොතෙන් ඔබට ඔබව පෙනී යයි. “මනුෂ්‍යයා පිටස්තර පෙනීම බලන්නේය. නමුත් ස්වාමීන්වහන්සේ සිත බලනසේක” (1 සාමුවෙල් 16:7). දෙවියන්වහන්සේ තරාතිරම නොබලනසේක.**

සාතන් (යක්ෂයා) සියලු බොරුකාරයන්ගේම පියාය. සෑම මනුෂ්‍යයෙක් රැවටීම පිණිස අන්ධකාරයේ කුමාරයා වූ මෙලොව අධිපති යක්ෂයා, ආලෝකයේ දූතයෙක් මෙන් ඔබ වෙත පැමිණෙයි. පෙර මෙන් අද ද, ක්‍රිස්තුස්වහන්සේගේ ගෝලයන් ලෙස බොරු අපෝස්තලුවරුන්ද, වංචාකාරයන් හා රැවටිලිකාරයන්ද අප අතර බොහෝ සිටිති. යක්ෂයාම ආලෝකයේ දූතයෙක් මෙන් පෙනී සිටීම පුදුමයක් නොවේ (2 කොරින්ති 11:13, 14). දෙවියන්වහන්සේ අපට ප්‍රේම කරන බවද, යේසුස්වහන්සේ අප ගළවන පිණිස දිවි පිදූ බවද නොපෙනෙන ලෙස, මෙලොව අධිපති යක්ෂයා, මිනිසාගේ නෙත් හා සිත් අන්ධකර තිබේ. පව්කරුන් හා නොඅදහන්නන් යක්ෂයාගේ ආත්මයෙන් පාලනය වන බැවින් ඔවුහු දෙවියන්වහන්සේගෙන් වෙන්ව අන්ධව සිටිති. (එපීස 2:2). එම නැතිවූ තත්ත්වය ගැන පැහැදී ඇස් අරිනා තුරු, ඔවුහු සදාකාල විනාශයට ගමන් කරමින් සිටිති. “මට පාපයක් නැත” කියන්නා තමාවම රවටා ගනියි. “දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් ප්‍රකාශ කරනු ලැබුවේ මේ පිණිසය. එනම්: යක්ෂයාගේ ක්‍රියා විනාශ කරන පිණිසය” (1 යොහන් 3:8). දෙවියන්වහන්සේට යටත්ව යක්ෂයාට විරුද්ධව සිටින්න. එවිට ඔහු නුඹලා වෙතින් පලා යනවා ඇත. දෙවියන්වහන්සේට ළං වෙන්න; එවිට උන්වහන්සේ නුඹලාට ළංවනසේක. (යාකොබ් 4:7—8)

Copyright ANGP

මෙම පොත කියවමින් එම පිංතූරු ඉගෙන ගන්නා විට, ඔබේ සිත ඔබටම පෙනී යන හෙයින් දෙවියන්වහන්සේගේ ආලෝකයට ඔබේ සිතේ තත්ත්වය පෙන්වීමට ඉඩ දෙන්න; ඔබගේ පාපය පිළි-ගන්න; පාපයක් නැතැයි නොකියන්න. උන්වහන්සේගේ වචනය මෙසේ කියයි: අපට පාපය නැතැයි කියමු නම්, අපි අපව රවටා ගනිමුව; සැබෑවද අප තුළ නැත. අපේ පාපවල් කියා දෙමු නම්, අපේ පව් අපට කමා කරන්ටත්, සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍ර කරන්-ටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටිනසේක (1 යොහන් 1:1—10). යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ලෙයින් අපේ සෑම පාප-යක් ඒකාන්තයෙන්ම සේදී යයි.

යක්ෂයාගෙන් නැතහොත් දෙවියන්වහන්සේගෙන් ඔබ පාලනය වන බැවින් ඔබ පාපයේ වහලෙක් නැතහොත් දෙවියන්වහන්සේගේ දසයෙකි. පාපය ඔබව පාලනය කරයි නම්, දෙවියන්වහන්සේට කන්නලව්කර එය කියන්න. එවිට පව්කරුන් මුදගැනීමට හා යක්ෂ-යාගේ බලය විනාශකර අප කෙරෙහි ඇති පාපයේ බලපෑමෙන් අප නිදහස් කිරීමෙහි ලා මෙලොවට පැමිණි යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් දෙවියන්වහන්සේ අප ගළවති. උන්වහන්සේ අපේ ගැළවීමය. ඔබේ සියලු රහස්ද, අබිරහස් ජීවිතයේ සිතිවිලි හා ක්‍රියාද දකිනා ධර්මිෂ්ඨ වූ දෙවියන්වහන්සේගේ අභිමුඛයේ දැන් ඔබ සිටියි. කිසි දිනක ඔබව හා ඔබේ ක්‍රියා දෙවියන්වහන්සේගෙන් සැඟවීමට නොහැකිය. කන් දුන්නාවූ එතුමාට නොඇසේද? ඇස් දුන්නාවූ එතුමාට නොපෙනේද?

''ස්වාමින්වහන්සේ කෙරෙහි සම්පූර්ණ සිත් ඇත්තන්ට පිහිට වන පිණිස උන්වහන්සේගේ බලය පාමින්, උන්වහන්සේගේ ඇස් පොළොව මුළුල්ලෙහි ඔබ මොබ දුවන්නෙහිය'' (2 ලේකම් 16:9).

''උන්වහන්සේගේ ඇස් මනුෂ්‍යයාගේ මාර්ගය කෙරෙහිය; ඔවු-න්ගේ සියලු යාම් ඊම් උන්වහන්සේ දක්නාසේක. අයුතුකම් කරන්නන්ට සැඟවී ඉන්ට පුළුවන් අන්ධකාරයක්වත් මරණ සෙවනක්වත් නැත (යෝබ් 34:21—22).

''නුමුත් යේසුස්වහන්සේ සියලු මනුෂ්‍යයන් දන්නා බැවින් ඔවු-න්ට තමන් බාර නොවූසේක'' (යොහන් 2:24).

''අපරාධයට කමාවත්, පාපයට වැස්මත් ලැබූ තැනැත්තා ආශී-ර්වාද ලද්දෙක්ය. ස්වාමින්වහන්සේ යමෙකුට අයුතුකම නොතබන-සේක්ද, යමෙකුගේ සිතේ වංචාවක් නැත්තේද, ඒ මනුෂ්‍යයා ආශීර්-

වාද ලද්දෙක්ය'' (ගීතාවලිය 32:1–2 ගීතාවලිය 5 ද කියවන්න). යේසුස්වහන්සේ මෙදන් කථාකර ඔබේ යහපත හා දියුණුව උදෙසා මෙම ප්‍රේමණීය ආරාධනාව ඔබට පිළිගන්වති: ''වෙහෙස වෙන්නාවූ, බර උසුලන්නාවූ සියල්ලෙනි මා වෙතට පැමිණෙන්න. මම නුඹලාට සහනය දෙමි'' (මතෙව් 11:28—30).

# චිත්‍ර විස්තරය


## පළමුවන චිත්‍රය

ලෞකිකවූ හා ගැළවීමක් නොළත් මිනිසෙකුගේ සිතක් මෙම චිත්‍රයෙන් පෙනෙයි. බයිබලය මොවුන්ව ''පව්කාරයා'' කියා විස්තර කර ඇත. එනම්, යක්ෂයා විසින්ද මාංසික කැදරකමින් හා තෘෂ්ණාවෙන්ද පාලනය වන තැනැත්තාය. ඇත්තෙන්ම මෙය දෙවියන්වහන්සේට පෙනෙන පරිදි චිත්‍රයට නැගූ සිතකි. හිතෝපදේශ 23:29–33 දක්වා ඇති පද මෙහි ඇති රෞද්‍ර, මත්වූ නෙත් ගැන මෙසේ පවසයි: ''දුක ඇත්තේ කාටද? කාලකන්නිකම කාටද? තරඟ කාටද? මැසිවිලි කාටද? නිෂ්කාරණ තුවාල කාටද? රතු ඇස් ඇත්තේ කාටද? මුද්‍රිකපානය (මත්පැන්) ළඟ පමා වෙන්නන්ටය. මිශ්‍ර කළ මිදි යුෂ (මත් පැන්) සොයා යන්නන්ටය. මුද්‍රිකපානය රතුව පෙනෙන විටත්, පාත්‍රයෙහි දිලිසෙන විටත්, සිනිඳු ලෙස වැක්කෙරෙන විටත් ඒ දෙස නොබලන්න. අන්තිමේදී එය සර්පයෙකු මෙන් හපා කා, පොළඟකු මෙන් දෂ්ට කරයි. නුඹේ ඇසට අන්‍ය ස්ත්‍රීන් පෙනෙන්නේය; නුඹේ සිත හිතුවක්කාර දෙය කථා කරන්නේය.''

සෑම පාපයකම වාසස්ථානය හා ආසනය වන සිත නොයෙක් පාප නිරූපනය කරන සතුන් විසින් තරණයකර ඇත. දෙවියන් වහන්සේ, උන්වහන්සේගේ අනාගතවක්තෘ යෙරෙමියා තුළින් මෙසේ පවසති: ''සියල්ලන්ට වඩා සිත රැවටිලිකාරව හා දුෂ්ටව තිබේ; එය කාට දැනගන්ට පුළුවන්ද? (යෙරෙමියා 17:9)

යේසුස්වහන්සේ මෙම කියමන ස්ථිර කරමින් මෙසේ කීසේක: ''මක්නිසාද, ඇතුළතින් එනම්, මනුෂ්‍යයන්ගේ සිතින් නපුරු සිතිවිලි, වේශ්‍යාකම, සොරකම, මිනීමැරීම, කාමමිථ්‍යාචාර

කම්, තණ්හා, දුෂ්ඨකම්, වංචාවන්, සල්ලාලකම්, ඊර්ෂ්‍යාවන් අපහාස කිරීම්, උඩඟුකම් සහ මෝඩකම් නික්මෙයි. මේ සියලු නපුරු දෙය ඇතුළතින් නික්මී මනුෂ්‍යයා අපවිත්‍ර කරයි (මාර්ක් 7:21–23).




## 1. පව්කාරයාගේ සිත

1 මොනරා–මොනරාගේ අලංකාරයට සැමදෙනම ප්‍රිය කරති. එහෙත් මෙහිදී උඩඟුකම නැමති පාපය මොනරා විසින් පිළිබිඹු කරයි. එක් කලක් අභිෂේකලත් ලූසිෆර් නැමති නායක දේවදූතයා දෙවියන් වහන්සේගේ පහන්තරුව වී සිටි මුත්, උඩඟුකම නිසා පාපයට වැටී

උන්වහන්සේගේ සතුරා විය. පාපයේ කතෘ වන මොහු දැන් යක්ෂයා ලෙස හැඳින්වේ. (යෙසායා 14: 9–17; එසකියෙල් 28:12–17).

උඩඟුකම සම්පූර්ණයෙන් අපායේ ගැඹුරෙන් පැමිණ නොයෙක් වෙස් මුහුණු ගනියි. සමහරු ධනය ගැන උඩඟුවෙත්; සමහරු තම උගත් තත්ත්වය ගැනද, තවත් අය විලිබිය නොමැතිව ඉතා පහත් ලෙස තම ශරීරය පෙන්වන ඇඳුම් ගැන උඩඟු වන අතර සමහරු තම රන් අභරණ ගැන උඩඟුවෙත්—මෙය යෙසායා 3:17 — 24 ඉතා පැහැදිලිව විස්තරකර ඇත. අන් සමහරු තම පරම්පරාව ගැනද, ජාතිය ගැනද, සංස්කෘතිය ගැනද උඩඟුවෙත්. ''දෙවියන්වහන්සේ උඩඟු අයට විරුද්ධව යටහතුන්ට කරුණා කරනසේක (1 පේතෘස් 5:5). ''උඩඟු කමටත්, අහංකාරයටත්, නපුරු මාර්ගයටත්, දෙවියන්වහන්සේ ද්වේශ කරනසේක'' (හිතෝපදේශ 8:13). ''විනාශයට ප්‍රථමයෙන් උඩඟු–කමද, වැටීමට ප්‍රථමයෙන් අහංකාර සිතද වෙයි'' (හිතෝපදේශ 16:18)

2 එළුවා – කාම ආශාව, දුශ්ශීලත්වය, සල්ලාලකම හා වෛශ්‍යාකම පිළිබිඹු කරයි. අද ලොව අවසන් කාලය වන මෙදවස්හි මෙම පාප බොහෝ සෙයින් වැඩි වී ඇත. අවුරුදු 2000 ට ප්‍රථම, මෙම අන්තිම කාලය සොදොම හා ගොමෝරාව වැනියයි යේසුස්වහන්සේ පැවසූ අනාගතවාක්‍යයේ සත්‍යතාවය අප පිළිගත යුතුය. මෙම නව පව්කාර ආත්මය සියලු පුරුෂයන් හා ස්ත්‍රීන් තදින් අල්ලාගෙන, සෑම ආගමකට අයත් මනුෂ්‍යයන්ද, ඒ ස්ථානද, පාසැල්ද, ශිෂ්‍ය නිවාසද විනාශකර ඇත. තවද, මේ විස බීජය කිසිම තැකීමක් හෝ ලැජ්ජාවක් නොමැතිව සිනමාහල්වලින් හා නාට්‍ය ශාලාවලින්ද, පහත් සාහිත්‍යයෙන් හා නොයෙක් ආකාර ප්‍රයෝගයෙන්ද සිතෙහි වපුරනු ලැබේ. දෙවියන්වහන්සේ පාපය නමින් හඳුන්වන මෙම දෙය අද ලොව නව සදචාරයක් බවට පත්ව තිබේ. කෝටි ගණන් තරුණ තරුණියන්, පවන්ගැන්මේ සිට තම යෞවන සමය මේවායින් හැඩගස්සා පසුව කරදරවලට වැටී ලැජ්ජාවෙන් පසුතැවිලිවෙමින් තැවෙති. දුශ්ශීල පහත් ජීවිත ගත කරන නළු නිළියන් අද බාල පරම්පරාවේ වීරයන් හා වීරියන් වෙති. නැටුම් ශාලා බොහෝ දුශ්ශීල දෙය පතුරුවන ස්ථාන වෙයි. දෙවියන්වහන්සේගේ ශුද්ධවන්තයෙක් වූ ජෝසප් (උත්පත්ති 30) නැමති අය නිදර්ශන වශයෙන් ගනු නොලැබේ. රූප වන්දනා කරමින් මිථ්‍යා දෙවිවරු ඇදහූ නොදියුණු සූලු (ZULU) වර්ගයා වෛශ්‍යාකම් කළ අය මරුමුවට පත් කළහ. මෙය නවීන ශිෂ්ඨාචාර–යට පාඩමක් උගන්වමින්, අප පහත් කිරීම පිණිස විනිශ්චය දවසේදී අපට විරුද්ධව ඔවුන් නැගී සිටිනු ඇත. දුශ්ශීලත්වයේ නොරැඳී එයින් පලායන මෙන් දෙවියන්වහන්සේ අපට අණකර ඇත.

Copyright AWGP

‘‘වෛශ්‍යාකමෙන් පලා දුවන්න. මනුෂ්‍යයා කරන සෑම පාපයක් ශරීරයෙන් පිටතය. නමුත් වෛශ්‍යාකම් කරන්නා තමාගේම ශරීරයට විරුද්ධව පව් කරන්නේය. මොනවා? නුඹලාගේ ශරීරය දෙවියන්වහන්සේගෙන් ලැබූ, නුඹලා තුළ ඇති ශුද්ධාත්මයාණන්වහන්සේගේ මාලිගාව බව නොදනිහුද? (1 කොරින්ති 6:18—19) යමෙක් දෙවියන්වහන්සේගේ මාළිගාව නාස්ති කරත් නම්, දෙවියන්වහන්සේද ඔහුව නාස්ති කරනසේක. මක්නිසාද, දෙවියන්වහන්සේගේ මාළිගාව ශුද්ධය; ඒ මාළිගාව නුඹලාය. (1 කොරින්ති 3:17)

3 ඌරා – බෙබදුකම හා කෑදරකම විදහාපායි. ඉතාමත් අපිරිසිදු කැත සතෙකි. තම මාර්ගයේ තිබෙන සෑම පිරිසිදු හෝ අපිරිසිදු දෙයම අනුභව කරයි. මෙලෙස පව්කාර සිතද, සෑම අපිරිසිදු යෝජනා හා ප්‍රකාශකිරීම්ද, අපිරිසිදු චිත්‍ර, සාහිත්‍යය හා වෙනත් අපිරිසිදු දෙය ද ප්‍රිය කරයි. දෙවියන්වහන්සේගේ ශුද්ධ මාළිගාව විය යුතු ශරීරය, දුම් බීමෙන් හා බුලත් හැපීමෙන්ද, ගංජා අබින් බීමෙන් හා මත් ද්‍රව්‍යය ගැනීමෙන්ද, සුරාපානයෙන් හා තවත් නොයෙක් පහත් පුරුදුවලින්ද අපිරිසිදුකර ඇත. පෙර නොවූ දුම් බීම හා මත් ද්‍රව්‍යය අද පුරුෂයන් හා ස්ත්‍රීන් තරයේ අල්ලා ගෙන සිටියි. මේවාට ගොදුරු වී යක්ෂයාට වහල් වූ අය බේරාගැනීමට හැකිවනුයේ දෙවියන්වහන්සේගේ බලයට පමණක්ය. ආගමට ලැදියාවක් දක්වන බොහෝ දෙන පූජනීය ගොඩනැගිල්ලක් ශුද්ධ ලෙස සළකා, ගෞරවයක් වශයෙන් එහි තුළ දුම් පානය නොකරති. නමුත් කිසිම හෘදය සාක්ෂියක් හෝ හැඟීමක් හෝ නොමැතිව, දෙවියන්වහන්සේගේ මාළිගාව වන ඔවුන්ගේ ශරීරය එම දුම් බීම නැමති දුගඳ වල් පැලැටියෙන් අපිරිසිදු කිරීමට ඔවුහු මැළි නොවෙති. ‘‘නුඹ නොදන්නෙහිද? අපෝස්තලු පාවුල් මෙසේ කියයි: නුඹේ ශරීරය ශුද්ධාත්මයාණන්වහන්සේගේ මාළිගාව බව; එය නුඹ අපිරිසිදු කරත් නම් දෙවියන්වහන්සේ නුඹව විනාශ කරනසේක; (1කොරින්ති 3: 16-17; 6: 18-19)

කෑදර මනුෂ්‍යයා දෙවියන්වහන්සේ ඉදිරියේ පිළිකුලකි. අප කෑම අනුභව කරන්නේ ජීවත්වෙන පිණිසය; නමුත් ජීවත්වෙන්නේ කෑම පිණිස නොව. සනීපශක්තිය ගෙන දෙන කෑම ගැනීමෙන් කුසගින්න නිවාගත හැක. නමුත් තෘෂ්ණාව නිතරම ‘‘මදි මදි’’කියා හඬ දෙයි.

තෘෂ්ණාව තෘප්තියට පත්කළ නොහැකියි. එහි ආශාව සංසිඳවීමට නුපුළුවන. පරණ ගිවිසුම අනුව, බෙබද්දන් හා කෑදරයන් ගල් ගසා මරුමුවට පත්කළහ. (ද්විතීය කථාව 21:18-21). ‘‘මක්නිසාද බෙබද්දත් කෑදරයාත් දිළිඳු වන්නේය. නිදිමත වැරහැළි

Copyright ANCP

ඇදීමට පමුණුවන්නේය. නාස්තිකාරයන්ගේ යහළුවා තම පියා ලැජ්ජාවට පමුණුවයි. (හිතෝපදේශ 23:21 හා හිතෝපදේශ 28:7). එක් ධනවත් මනුෂ්‍යයෙක් බේබදුකමට හා තෘෂ්ණාවට වහල්ව මරණයෙන් පසු අපා ගත වී, කෲර වධ විඳීම්වලට සදාකාලිකව භාජනය විය. මෙයින් මත්පැන්වල ඇති නරක හා නපුර කීමට වුවමනාවක් නොමැත. මෙය සැහැල්ලුවට භාරගැනීම මෝඩකමකි. කිසිම බේබද්දෙක් ස්වර්ග රාජ්‍යයට ඇතුළ් නොවන බව දෙවියන් වහන්සේගේ වචනය සඳහන් කරයි. මත්පැන් කෑමක් නොවේ. නමුත් භයානක විස බීමකි. මෙය කල්පනාවන් පටලවා නොයෙක් පාපිෂ්ඨ ප්‍රතිඵල ගෙන දී මිනිසාව තිරිසනෙක් කරයි. මෙම බීම නිසා දුශ්චරිතයෙන් පිරුණු ඔහු, දුගී භාවයට පත්වෙයි. තවද එකිනෙකා මරා ගනිමින් ජීවත් වෙයි. ''මුද්‍රික පානය (මත්පැන්) සරදම් කරන්නෙක්ය. මද්‍ය පානය කෝලාහල කාරයෙක්ය. එයින් වැනෙන කවුරු නමුත් ඥානවන්ත නොවෙයි (හිතෝපදේශ 20:1).

මත්පැන් ගන්නා අය මෙන්ම ඒවා නිපදවා විකුණන්නන්ද දෙවියන්වහන්සේ ඉදිරිපිට වැරදිකාරයෝය. දෙවියන්වහන්සේ මෙසේ කියති: ''මුද්‍රික පානය බීමට සමර්ථ, සුරා මිශ්‍ර කිරීමට ධෛර්යමත් මනුෂ්‍යයන්ට දුක්වේ''(යෙසායා 5:22). තම අසල්වැසියාට බොන්ට දී ඔහුව මත්පැනින් මත් කරන්නාට දුක්වේ'' (හබක්කුක් 2:15). ''ඔවුන්ගේ මංගල්‍යවල වීණාව සහ කුඩා වීණාවත්, රබානත්, නළාවත්, මුද්‍රික පානයත් ඇත. නමුත් ඔවුන් ස්වාමින්වහන්සේගේ ක්‍රියා සළකන්නේවත්, උන්වහන්සේගේ අත්වල ක්‍රියාව කල්පනා කළේවත් නැත'' (යෙසායා 5:12). ''අධර්මිෂ්ඨයන් දෙවියන්වහන්සේගේ රාජ්‍ය උරුම කරගන්නේ නැති බව නුඹලා දන්නේ නැද්ද? නොරැවටෙන්න, වෛශ්‍යකම් කරන්නෝවත්, රූප වඳින්නෝවත්, කාමමිථ්‍යා චාරිකයෝවත්, ස්ත්‍රීන් ලෙස හැසිරෙන්නෝවත්, පිරිමින් සමග අනාචාරකම් කරන්නෝවත්, සොරුවත්, ලෝභයෝවත්, බේබද්දෝවත්, නින්ද කරන්නෝවත්, කොල්ල කන්නෝවත්, දෙවියන්වහන්සේගේ රාජ්‍ය උරුමකර නොගන්නෝය ( 1 කොරින්ති 6:9–10).

ලෞකික පාප වැරදීමකින් සිදු නොවෙයි. මින් සමහරක් නම්: වෛශ්‍යාකම, අපවිත්‍රකම, සල්ලාලකම, රූප වැඳීම, මායාව, සතුරුකම, විවාදය, ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, පක්ෂවාදීකම, භේද, ලබ්දි භේද, වෛර, බීමත්කම, මංගල්‍ය ගෝෂා හා තවත් එවැනි දේවල්ය. මෙබඳු දෙය කරන්නන්ට දෙවියන්වහන්සේගේ රාජ්‍යය උරුම කරගැනීමට නොහැකිය (ගලාති 5:19–21). මුද්‍රික පානයෙන් මත් නොවෙන්න; එයින් අනාචාරකම් හටගන්නේය. නමුත් ආත්මයාණන්වහන්සේගෙන් පූර්ණව සිටින්න (එපිස 5:18).

පිපාසයෙන් පෙළෙන්නන්ට යේසුස්වහන්සේ මෙම ආරාධනාව පිළිගන්වති: "යමෙකුට පිපාසය ඇත්නම්, ඔහු මා වෙත පැමිණ ජීවනදයක වතුර නොමිළයේ බීවාවේ" (යොහන් 7:37–38). "පිපාසය ඇති සියල්ලෙනි, වතුර වෙත එන්න; මුදල් නැත්තෙනි, නුඹලාත් පැමිණ ධාන්‍ය ගෙන කන්න. එසේය, ඇවිත් මිළ මුදල් නැතිව, මිදි යුෂද කිරිද ගන්න" (යෙසායා 55:1). "මා දෙන පැන් පානය කරන අයට කිසි කලෙක පිපාසය නොවන්නේය. මා ඔහුට දෙන වතුර ඔහු තුළ සදකාල ජීවනය නික්මෙන වතුර උල්පතක් වන්නේ යයි කීසේක (යොහන් 4:14).

4 ඉබ්බා-මෙයින් පෙන්වනු ලබන්නේ අලසකම,සෙමින් ගමන කල් දැමීම, සූනියම් හා මන්ත්‍ර යනාදියයි. අවිශ්වාසය සූනියම් කරන පාපයක් මෙනි. "අලසයාගේ ආසාව ඔහුව විනාශ කරයි. මක්නිසාද, ඔහුගේ අත්, වැඩ කිරීමට අකමැති බැවිනි. දවස මුළුල්ලේ ගිජු ලෙස ආසා වන්නෙක් ඇත. එහෙත් ධර්මිෂ්ඨයා නොවළක්වා දෙන්නේය. (හිතෝපදේශ 21:25–26). "භූමිය අයිති කරගැනීමට අලස නොවන්න" කියා ඉශ්‍රායෙල් සෙනහට යෝෂුවා කීය. මනුෂ්‍යය ස්වභාවය දෙවියන්වහන්සේගේ දෙය ලබාගැනීමට අලසවෙයි; එමෙන්ම ප්‍රමාද වෙයි. යේසුස්වහන්සේ මෙසේ කීසේක: "පටු දෙරෙන් ඇතුල් වීමට වීරිය කරන්න" (ලූක් 13:24). "සොයන්නාට සම්භවේ." "ස්වර්ග රාජ්‍යයට බලහත්කාරයෙන් ගනු ලැබේ. බලහත්කාරකම් කරන්නෝ ඒක බලෙන් අල්ලා ගනිති" (මතෙව් 11:12).

ගැලවීම හා ආත්මික දියුණුව සඳහා ප්‍රමාදය ඔබව අපාගත කරන මගකි. තවද, මෙය ඔබේ යාඥවද, දෙවියන්වහන්සේගේ ගැඹුරු දෙය සෙවීමද, උන්වහන්සේගේ ධනවත් අලංකාර පොරොන්දු ලබාගැනීමද වළක්වා ඔබව විනාශයට ගෙන යයි. ඔබේ සම්පූර්ණ සිත අද අවංකව උන්වහන්සේට භාරදෙන මෙන් දෙවියන්වහන්සේ ඉල්ලන කළ, ඔබව සදකාලිකව විනාශ කරලීමට මාන බලමින් සිටින යක්ෂයා, එය වෙනත් පහසු දිනක කරන ලෙස ඔබට පවසයි. රැවටෙන්න එපා; මෙම දවස කිසි කලෙක උද නොවෙයි! ඔබ යක්ෂයාගේ හඬට කීකරු වී දෙවියන්වහන්සේගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරත් නම් ගැළවීම හා ක්‍රිස්තුස්වහන්සේද නොමැතිව මරුමුවට පත්වෙයි. දෙවියන්වහන්සේ මෙසේ කීසේක: "අද නුඹලා උන්වහන්සේගේ හඬ අසන්නහු නම් සිත තද නොකරගන්න" (හෙබ්‍රෙව් 3:7–8). කවදවත් නොපැමිණෙන පහසු දිනකට ගැළවීම කල් දැමීමෙන් බොහෝ දෙනෙක් මරු වැළඳගෙන ඇත. හෙට දවස ඔබේ නොවෙයි.

හූනියම් කිරීමට ඉබ්බාගේ කටට බොහෝ විට මන්ත්‍රකාරයෝ ප්‍රයෝජනයට ගනිති. මෙයින් පෙන්වන පාපය නම්, දෙවියන්වහන්සේගේ

Copyright ANCP

බලය විශ්වාස නොකර, හූනියම් හා ශාස්ත්‍ර කෙරෙහිද, අංජනම් එළි කෙරෙහිද විශ්වාස කිරීමය. අපට උදව් කිරීමට දෙවියන්වහන්සේ සූදානමින් සිටිති. විශේෂයෙන් පරීක්ෂා කාලවලදී, ලෙඩ දුකේදී, හතුරුකම්වලදී හා පාඩු විඳීම්වලදී ජීවමාන දෙවියන්වහන්සේගෙන් පිහිට ඉල්ලා ගැනීමට අපට කියා තිබේ; නුමුත් වාසනාව උරගා බැලීමට නොවේ. ''යහපත් මනුෂ්‍යයෙකුගේ මාර්ගය ස්වාමීන්වහන්සේ ස්ථිර කරනසේක (ගීතාවලිය 37:23). ''නුඹලා අතරෙන් යමෙක් රෝගාතුරව සිටින්නෙහිද? ඔහු සභාවේ වැඩිමහල්ලන්ට අඬගසත්වා. ඔවුහු ස්වාමීන්වහන්සේගේ නාමයෙන් ඔහුට තෙල් ආලේපකර ඔහු උදෙසා යාඥා කරත්වා. එවිට ඇදහිල්ලේ යාඥාවෙන් රෝගාතුරයාට සුවය ලැබේ. ස්වාමීන්වහන්සේ ඔහු නැගිටුවනවා ඇත. ඔහු පාපයක් කර තිබේ නම්, ඒවා ඔහුට කමා කරනු ලැබේ. එහෙයින් නුඹලාගේ වරද එකිනෙකාට කියා දී සුව ලැබෙන පිණිස එකිනෙකා උදෙසා යාඥා කරත්වා (යාකොබ් 5:14—16). ''මක්නිසාද උසස්කම නැගෙනහිරින්වත්, බස්නාහිරින්වත්, දකුණෙන්වත් නොවන්නේය. නමුත් දෙවියන්වහන්සේ විනිශ්චයකාරයාණෝය'' (ගීතාවලිය 75:6—7). දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් සෙනඟට මෙසේ අණ කළසේක: ''තම පුත්‍රයා හෝ දුව ගිනි මැදින් යවා පූජා කරන කෙනෙක්වත්, ජෝන කියන්නෙක්වත්, නිමිති බලන්නෙක්වත්, ශාස්ත්‍ර කියන්නෙක්වත්, මායා කාරයෙක්වත්, මතුරන්නෙක්වත්, ආත්ම බන්ධන කාරයෙක්වත්, අනාවැන කාරයෙක්වත්, මළවුන්ගෙන් විචාරන්නෙක්වත්, නුඹ අතරෙහි නොසිටීවා. මක්නිසාද මේ දේ කරන කවරෙක් නමුත් ස්වාමීන්වහන්සේට පිළිකුලක්ය'' (ද්විතීය කථාව 18:10–12). දෙවියන්වහන්සේගේ රාජ්‍යයෙන් පිටත වසන්නෝ නම්, මන්ත්‍රකාරයෝද, වෛශ්‍යාකම් කරන්නෝද, මිනීමරුවෝද, රූප වඳින්නෝද, බොරුව ප්‍රිය කරන්නෝ සහ බොරු කියන්නෝත්ය'' (එළිදරව් 22:15). ඔබ මේ අශුද්ධාත්මවලට හෝ ශාස්ත්‍රකාරයන්ට හෝ ඔවුන්ගේ විමසීම්වලට හෝ නොහැරී, ඔවුන් සමග පව් නොකර මෙවායින් කිළිටි නොවී ජීවත්වන්න. ''නුඹේ දෙවි වූ ස්වාමීන්වහන්සේ මමය'' (ලෙවී 19:31). ''ඔවුහු කෙඳිරිගාන්නාවූ තොල් මතුරන්නාවූ ආත්ම බන්ධනකාරයන්ගෙන්ද, අනාවැකි කාරයන්ගෙන්ද, විභාග කරන්නැයි නුඹලාට කියන විට, සෙනඟක් විසින් ස්වකීය දෙවියන්වහන්සේගෙන් විභාග කරන්ට යුතු නොවේද? ජීවතුන් උදෙසා මළවුන්ගෙන් විචාරන්ට යුතුදැයි අසන්න. ව්‍යවස්ථාවද, සාක්ෂියද වෙතට යමු. ඒ වචනයේ හැටියට ඔවුන් නොකීවොත්, ඔවුන්ට පහන්වීමක් නැත'' (යෙසායා 8:19–20)

මෙම පොත කියවීමෙහි නියැලි සිටින ඔබට දෙවියන්වහන්සේ කථාකර: දරුව, පාපයට පසුතැවිලි වී, ඔබේ සම්පූර්ණ ජීවිතය මට භාර දෙන්න'' කියා ඔබෙන් ඉතා ආදරයෙන් ඉල්ලනසේක.

Copyright ANCP

නමුත් ඔබ සිතෙහි ඇති ඉබ්බාගේ ආත්මය, සිත බියෙන් පුරවා, ඔබේ තීරණය කල් දැමීම පිණිස මෙලෙස නොයෙක් යෝජනා ගෙනෙයි: ''මම සැබෑ ක්‍රිස්තියානිකරුවෙකු වූ විට මගේ දෙමාපියන්, සහෝදර සහෝදරියන්, නෑදෑ මිතුරන් හා ලෝකයා මොනවා කියයිද? මින් පසු නැටුම්වලට, මීථ්‍යා උත්සවවලට හා නොහොබිනා ලෞකික විනෝදවලට සහභාගිවීමට බැරිව ගිය විට කුමක් වේද?'' යේසුස්වහන්සේගේ සදාකාල වස්තූන් දෙසද, පුදුමාකාර සමාදානයද, වචනයෙන් කිව නොහැකි ප්‍රීතියද, උන්වහන්සේගේ තේජසද, සියලු ප්‍රීතියෙන් යුත් අමරණීය ජීවිනයද නොබලා, යේසුස්වහන්සේ පිළිගත් කළ ඔබ අත්හැරිය යුතු දෙය ගැන කල්පනා කරමින්, මිනිස් භීතයෙන් හා මරණ බියෙන් පිරී ඔබ යක්ෂයාට වහළෙක් වී සිටියි. අධෛර්‍යය නොවන්න! මුළු ජීවිත කාලයේදීම වහලුන් මෙන් මරණ බියෙන් ජීවත්වන සැමදෙනම ගළවාගැනීමට යේසුස්වහන්සේ පැමිණ සිටිති! (හෙබ්‍රෙව් 2:14–15). ප්‍රවේසම් වෙන්න! කල් දැමීමේ ආත්මය, ඔබේ සිත ඉබ්බාගේ කට්ට මෙන් තද කිරීමට තැත් කරයි.

5 දිවියා – ඉතා නපුරු රෞද්‍ර, සතෙකි. බොහෝ විට සිත වෛරයෙන්, හා භයානක කිපීමෙන් පාලනය වී, මිනී මැරීමටද පෙළඹෙයි. මේ නපුරු කිපීම වළක්වා ගැනීමට හෝ යටපත් කරගැනීමට කොපමණ වෑයම් කළත්, මෙය සියලු රෞද්‍රකම් සමග එකවිටම පුපුරා පැන නගියි. මෙය ඔබේ සිතේ තිබෙන බව පිළිගෙන, ඔබව මෙයින් බේරාගැනීම පිණිස යේසුස්වහන්සේට කන්නලව් කරන්න. ''නුඹලා කෝප නොවෙත්වා (උත්පත්ති 45:5). ''තරහ-වෙන් වැළකී උදහස අත්හරින්න; කල නොකිරෙන්න; එයින් හට-ගන්නේ නපුරු ක්‍රියා පමණක්ය'' (ගීතාවලිය 37:8). ''උදහස කෲරය, කෝපයද රෞද්‍රය. එහෙත් කාම ක්‍රෝධය ඉදිරිපිට සිටින්ට පුළුවන් කාටද?' (හිතෝපදේශ 27:4)

''කෝපය පවතින්නේ අඥානයන්ගේ ළයෙහිය. එමනිසා සිතින් කෝපය පහකරන්න'' (දේශනාකාරයා 7:9;11:10). සියලු කෝපය පහකරන්න.'' (කොළොස්සි 3:8)

නපුරු ක්‍රියාවන් හා පළිගැනීම් සඳහා බොහෝ බියගුල්ලන් මත්පැන් බී දිරි ගනිති. ඔවුන්ගේ මුද්‍රික පානය (මත්පැන්) සර්පය-න්ගේ විසය, පොළඟුන්ගේ සැර විසය'' (ද්විතීය 32:33). අප වෙනු වෙන් පළිගන්නේ දෙවියන්වහන්සේය. නමුත් පව්කාර සිතට පළිගැනීම මිහිරිය. යේසුස්වහන්සේ මෙසේ අපට අවවාදකර ඇත: ''ඔබට මෙන් ඔබේ අසල්වැසියාට ප්‍රේම කරන්න'' ''ඔබේ

සතුරාට ප්‍රේම කරන්න.'' අපට විරුද්ධව වැරදි කරන්නන්ට සමාවූ විට, දෙවියන්වහන්සේ අපේ පව්වලට සමාව දෙන බවට පොරොන්දු වී ඇත. සිත රිදී, කෝපයෙන් කොඳුරමින් සිටින ආත්මයද දෙවි-යන්වහන්සේට පිළිකුළක්ය. ලේ හැලීම සඳහා ඇති නපුරු තෘෂ්-ණාවන් හා චේතනාවන් සිතෙහි තිබෙන බැවින් එයට එරෙහිව සැබෑ සමාදනය නිරතුරුව හා ස්ථිරව සිතෙහි තහවුරු කරගත යුතුය.

6 නයා – ඒවව ඒදන් උයනේදී රවටා, දෙවියන්වහන්සේ සමග තිබූ මිහිරි සබඳකම හා එකඟත්වය විනාශ කළේය. ආදම් සහ ඒව ලුසිපර්ගේ තැන ගෙන දෙවියන්වහන්සේ සමග සම්පූර්ණ සබඳ-කම් පවත්වමින්, මෙලොව පාලකයන් වී සිටි නිසා, පහළ හෙලූ දේව දූතයා වන සාතන්, ඊර්ෂ්‍යාවෙන් පිරුනේය. දෙවියන්වහන්සේ සමග තිබූ ඔවුන්ගේ එම පුදුම සහභාගිකම විනාශ කිරීමට සාතන්ගේ ඊර්ෂ්‍යා සහගත සැලැස්ම සමත් විය. තම අසල්වැසියාගේ ප්‍රීතියට හා සැපතට බොහෝ දෙන ඊර්ෂ්‍යාවීම නිසා, ඔවුහු ඔවුන්ගේම ප්‍රීතිය විනාශ කරගනිති. ''ක්‍රෝධය මිනීවල මෙන් කෲරය'' (සලමො න්ගේ ගීතිකා 8:6). මෙය අන්‍යයන්ගේ ප්‍රීතිය බිඳ දැමීම පිණිස නපුරු සිතුවිලි ගෙන දී මිනීමැරීමටද පොළඹවයි. විශේෂයෙන් මෙය බොහෝ විවාහ ජීවිතවල ඇත. තවද වෙළඳ ව්‍යාපාරවලදී හා ජීවිතයේ නොයෙක් අවස්ථාවලදී බොහෝ වෛර හා විපත්ති ඇති කරයි. දෙවියවහන්සේ තමාට වඩා තව කෙනෙකුව බලසම්පන්නව පාවිච්චි කරන කල්හි සමහර ක්‍රිස්තියානි සේවකයෝද, දේශනාකාරයෝද, දේවගැතිවරයෝද මේ ඊර්ෂ්‍යාවන්ට ගොදුරු වෙති. යක්ෂයාගේ ඊර්ෂ්‍යා ආත්මයෙන් කැළලක් නොවන පිණිසද, දෙවියන්වහන්සේට ප්‍රයෝජන වන පිණිසද, උන්වහන්සේගේ සේවය පිණිසද, සෑම මොහොතේදීම ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් අප සිත තුළට වගුරු වන දෙවියන්වහන්සේගේ නිර්මල ප්‍රේමයෙන් පූර්ණ වී සිටිය යුතුයි.

7 ගෙම්බා – පසෙහි ඇති දෑ අනුභවකරමින් ජීවත් වෙන්-නෙකි. මෙයින් ලෝභකම හා සෑම නපුරකම මුල වන මුදලට ඇති තණ්හාව පෙන්වා දෙයි (1 තිමෝති 6:10). කොන්ගෝවෙහි වෙසෙන සමහර ගෙම්බන්, බඩ පිපිරී මැරෙන තුරු අනුභව කරන සැටි දැක තිබේ. ලෝභ තැනැත්තා, දිළිඳුන්ට අත දිගු කිරීමට මැලි වෙයි; නමුත් මලකඩ හා කාවෝ කා විනාශ වන ධනය ලබාගැනීමට, කිසිම මැළිවීමක් නොවී ඕනෑම සාධාරණ හෝ අසාධාරණ මාවත් තුළින් තැත් කරයි. යේසුස්වහන්සේ මෙසේ කීසේක: ''පොළොවෙහි නුඹලාට වස්තු රැස්කර නොතබන්න; එහිදී කාවෝද, මළකඩද එවා නාස්ති කරති; සොරුද උමංකැන සොරා ගනිති. නමුත් ස්වර්ගයෙහි නුඹලාට වස්තු රැස්කර තබාගන්න; එහිදී මළකඩවත්, කාවෝවත් ඒවා නාස්ති නොකරති. සොරුද උමංකැන සොරා නොගනිති. මක්-

Copyright AHCP

නිසාද නුඹේ වස්තුව යම් තැනෙක්හිද නුඹේ සිතත් එතැන්හිම වන්නේය'' (මතෙව් 6:19–21). රන් රිදීවලටද වටිනා මැණික් හා ඇඳුම් වලටද තිබූ ආලය නිසා ආචන් හා මුළු පවුලම විනාශ වූහ. (යෝෂුවා 7 පරි:). මුදලට ඇති කෑදරකම නිසා තම ස්වාමියා හා ගුරුතුමා වන යේසුස්වහන්සේව පාවා දුන් උන්වහන්සේගේ ගෝළයෙක් වූ යුදස් ඉස්කාරියොත් එල්ලී මළේය. මුදල් හෝ රන් නරක නොවේ. නමුත් මුදලට සිතේ හැංගී තිබෙන කෑදරකම ඉතා නපුරුය; භයානකය.

දහස් ගණනින් සෑම පංතිවල හා ජාතිවල පුරුෂයින් හා ස්ත්‍රීන් නපුරු තණ්හාව නිසා විශාල මිළක් අශ්වයින්ට හා සුනඛයින්ට ඔට්ටු අල්ලමින්, විශාල ඉක්මන් ධනයක් ලබාගැනීමට ගොස්, ඔවුන්ගේම ජීවිත හා පවුල් ජීවිත විනාශ කරගෙන ඇත. වැඩි වෙහෙසීමක් නොමැතිව පොහොසත්වීමට ඇති තණ්හාව සොරකමටත්, මිනී මැරීමටත්, දිවි නසා ගැනීමටත් මග පාදයි. මුදලට ඇති ආසාවට හා කෑදරකමට බොහෝ මිතුරන් සිටිති. එනම්, ප්‍රසිද්ධියට හා බලයට ඇති ආසාව; මෙය අන්‍යයන් පාලනය කිරීම සඳහා දේශපාලන බලය හෝ දුප්පතාට පීඩා කිරීම පිණිස ධන බලය විය හැක; තවද ආගමික බලය—එනම් : දෙවියන්වහන්සේට වඩා ආගමික ආයතනයක නාමයක් ගැනීමට ඇති උනන්දුව නිසා තම දේවස්ථානයට කීකරු නොවී, යේසුස්වහන්සේ අනුගමනය කරන සාන්තුවරයන් පහත් කිරීම (මාර්ක් 9:38). යේසුස්වහන්සේ මෙසේ කීසේක: **''සියලු ආකාරයේ ලෝභකමින් ප්‍රවෙසම්වීමට බලාගන්න. මක්නිසාද මනුෂ්‍යයෙකුට කොපමණ දේපළ තිබුනත්, ඔහුගේ ජීවිතය එහි පිහිටා නැත'' (ලූක් 12:15)** පොහොසත් අඥනයාගේ කථාව මෙසේය: ''එක් වස්තුකාරයෙකුගේ පොළොවෙහි බොහෝ බෝග හට ගත්තේය. එවිට ඔහු තමාගේ සිත තුළ කල්පනා කරනුයේ: කුමක් කරම්ද? මාගේ බෝග රැස්කර තබන්ට ඉඩ නැත. මම මෙසේ කරමි. මාගේ ගබඩා කඩා දමා, වඩා ලොකු ඒවා ගොඩනගා එහි මාගේ සියලු ධාන්‍යයද, බඩුද රැස්කර තබා, ප්‍රාණය, නුඹට බොහෝ අවුරුදු ගණනකට හොඳවූ, බොහෝ කෑම රැස්කර තිබේ ; පහසු ගෙන කා බී, ප්‍රීතියෙන් සිටින්නැයි මාගේ ප්‍රාණයට කියමියි කීවේය. නමුත් දෙවියන් වහන්සේ ඔහුට කථාකර: ''අඥනය, අද රාත්‍රියේදී නුඹේ ප්‍රාණය නුඹෙන් අයකරනු ලැබේ. එවිට නුඹ සූදනම් කළ දෙය කාට වන්නේදැයි'' කීසේක. දෙවියන්වහන්සේ කෙරෙහි පොහොසත් නොවී තමාටම වස්තු රැස්කරගන්නා අය එයාකාරය. (ලූක් 12:16–21) ''මක්නිසාද යම් මනුෂ්‍යයෙක් මුළු ලෝකය ලබාගත්තත් තමාගේ ප්‍රාණය නැතිව ගිය විට ඔහුට ඇති ප්‍රයෝජනය කුමක්ද?'' (මාර්ක් 8:36). ''කුමක් කමුද කියා ජීවිතය ගැනවත්, කුමක් අඳිමුද කියා ශරීරය ගැනවත් කනස්සලු නොවෙන්න. නමුත් උන්වහන්සේගේ

Copyright ANCP

රාජ්‍ය සොයන්න. නුඹගේ වස්තුව කොතැනද, නුඹේ සිතත් එතැනමය'' (ලූක් 12:22-34).

8 සාතන් – (යක්ෂයා) සෑම බොරුකාරයන්ගේද, බොරු සාදන්නන්ගේද පියාය. සියලු පාපවලට අනුබල දෙන්නා හා සිත පාලනය කරන්නාය. යේසුස්වහන්සේ මෙසේ කීසේක: ''නුඹලා නුඹලාගේ පියා වූ යක්ෂයාගෙන්ය. නුඹලා නුඹලාගේ පියාගේ තෘෂ්ණාවන් ඉෂ්ට කරන්ට කැමතිය. ඔහු පටන්ගැන්මේ සිට මිනී මරන්නෙක්ය. ඔහු තුළ සැබෑකම නැති හෙයින්, ඔහු සැබෑවෙහි නොපැවතුනේය. ඔහු බොරුවක් කියන කළ, තමාගේම දේ කියයි. මක්නිසාද ඔහු බොරුකාරයෙක්ය; බොරුවේ පියාය.'' (යොහන් 8:38-44). ලොකු බොරුවක් මෙන්ම පොඩි බොරුවත් භයානකය. කථා කරන ලද, ලියන ලද, ක්‍රියාවෙහි දමන ලද බොරු ඇත. වංචාකාරයාද බොරුකාරයෙකි. එමන්ද ඔහු නොවන දෙය ඔහු පෙන්වන බැවිනි (බොරු වේෂයක්). දෙවියන්වහනසේට බොරු කීමට බැරිය. පිරිසිදු ක්‍රිස්තියානිකරුද එලෙසමය (තීතස් 1:1). ''අපට උන්වහන්සේ සමඟ පංගුකාරකම ඇතැයි කියමින්, අන්ධකාර යෙහි හැසිරෙමු නම්, අපි බොරු කියනවා මිස සැබෑව නොකරමුව'' (1 යොහන් 1:6). පිටත සිටින්නෝ නම්, බල්ලෝද, මායම්කාරයෝද, වෛශ්‍යාකම් කරන්නෝද, මිනී මරන්නෝද, රූප වඳින්නෝද, බොරුවකට ප්‍රිය වෙන්නාවූ හා එය කරන්නාවූ සියල්ලෝද වෙති'' (එළිදරව් 22:15). බොරු සාක්ෂිකාරයාටත්, බොරුකාරයාටත් දෙවියන්වහන්සේ වෛර කරනසේක. (හිතෝපදේශ 6:19)

Copyright ANCP

9 තරුව— සෑම මිනිසෙකුගේම හෘද සාක්ෂිය ගැන කථා කරයි. නොකඩවා දූන දූන පව් කිරීම නිසා මෙය අපිරිසිදු වී නපුරුව ඇති හෙයින් තම ක්‍රියා විනිශ්චය කරගැනීමට නොහැකි වන ලෙස අන්ධව මුළාවී තිබේ. සමහර අවස්ථාවලදී, නපුරු හෘද සාක්ෂිය නිහඬ වෙයි; අන් අවස්ථාවලදී කරදරයට පත්වෙයි. සමාව දීමට තිබෙන විට වරදට පත් කරයි; වරදට පත් කිරීමට තිබෙන විට සමාව දෙයි. ඇඳහිල්ලෙන් වෙන් වූ මෙය, රත් වූ යකඩයකින් පිළිස්සුවා මෙන් සියලු වටහාගැනීම් හා හැඟීම් නැති කරගෙන, මුළාකරවන ආත්ම යන්ද, යේසුස්වහන්සේගෙන් නොවන යක්ෂයින්ගේ ධර්මයන්ද පිළිගෙන වංචාකාර මුසාවාද දෙඩවයි. (1 තිමොති 4:1-2 හා හෙබ්‍රෙව් 10:12)

10 ඇස – සිතෙහි ඇති සෑම දෙයක්ම දෙවියන්වහන්සේගේ ඇසට පෙනෙයි. උන්වහන්සේගේ ගිනි දළු වැනි නෙත්වලින් කිසිම දෙයක් සැඟවීමට නුපුළුවන. එමනිසා සියලු සිතිවිලිද, අදහස්ද

උන්වහන්සේ දන්නාසේක; සන අන්ධකාරයක හෝ සණ වනාන්තරයක හෝ ගැඹුරු අගලක හෝ කොතැනකදී හෝ වේවා, ඔබගේ පාපිෂ්ඨ නපුරු ක්‍රියා උන්වහන්සේට පෙනෙති. (චිත්‍රවල ඇති ඇස මනුෂ්‍යයාගේ මුහුණේ ප්‍රකාශවීම හා සම්බන්ධය).

11 කුඩා ගිනිදළු – පව්කරුගේ සිත දෙවියන්වහන්සේගේ ප්‍රේමයෙන් වැටලී තිබෙන බවට සාක්ෂි දරයි. දෙවියන්වහන්සේ පාපයට වෛරකර, මනුෂ්‍යයාට ප්‍රේම කරනසේක. උන්වහන්සේගේ කැමැත්ත, පව්කරුගේ මරණය නොව, නමුත් ඔහු පසුතැවිලි වී ජීවත්වෙනවා බැලීමය. පව්කරුන් ගළවන පිණිස යේසුස්වහන්සේ ආසේක. පසුතැවිලි වෙන්නාවූ එක් ආත්මයක් ගැන මුළු ස්වර්ග රාජ්‍යයම මහත් ලෙස ප්‍රීති වෙති. **"යේසුස්වහන්සේ ලෝකයේ පාපය දුරු කරන දෙවියන්වහන්සේගේ බැටළු පැටවාණෝය"** යේසුස්වහන්සේගේ අමිළ ලෙය ගැනද මෙම ගිනි දළු කතා කරයි.

12 දේවදූතයා – දේව වචනයයි. රැවටීමට හා පාපයට ගොදුරු වී සිටින සියලුදෙනම පසුතැවිලි වී, ඔවුන් තුළට උන්වහන්සේගේ ආලෝකයට හා ප්‍රේමයට ඒමට ඉඩ දෙකියි යන බලාපොරොත්තුවෙන්ද ඔවුන් සමග කථා කිරීමටද දෙවියන්වහන්සේ බලා සිටිති.

13 පරෙවියා – ශුද්ධාත්මයාණන්වහන්සේගේ ලාංඡනයය. එමෙන්ම පාපයද, ධර්මිෂ්ඨකමද, විනිශ්චයද පෙන්වා දෙන, සැබෑවූ ආත්මයාණෝය. පාපිෂ්ඨ සිතට ඇතුල්වීමට බැරි නිසා, උන්වහන්සේ එම සිතින් පිටත සිටිති.

Copyright ANGP

මෙම පින්තූර ඔබගේ සිත සමග සම්බන්ධ නම්, යේසුස් වහන්සේට කන්නලව්කර දෙවියන්වහන්සේට සිත ඇර, උන්වහන්සේගේ වචනයේ ආලෝකයට බබළන්ට ඉඩ හරින්න. **"ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේව විශ්වාස කරන්න. එවිට ඔබ ගළවනු ලබන්නේය**. ඔබගේ සිත වෙනස්කර අළුත් සිතක්ද, අළුත් ආත්මයක්ද ඔබ තුළ තැබීමට දෙවියන්වහන්සේ පොරොන්දු වී සිටිති. මෙහි සත්‍යතාවය දෙවන චිත්‍රයෙන් විස්තරකර තිබේ.

## දෙවන චිත්‍රය

දෙවියන්වහන්සේව සෙවීමට පටන්ගෙන ඇති පසුතැවිලි වූ සිතකි. දේවදූතයා – දේව වචනය නැමති කඩුව ගෙන ඇත. "මක්නිසාද දෙවියන්වහන්සේගේ වචනය ජීවමානය, බලසම්පන්නය;

කිසිම දෙමුවහත් කඩුවකටත් වඩා තියුණුය. ප්‍රාණය හා ආත්මයද සන්ධි හා ඇට මිදුළුද වෙන් කරන තරමට කා වදින්නේය. සිතේ සිතිවිලිද අදහස් ද විමසන්නේය'' (හෙබ්‍රෙව 4:12). ''පාපයේ කුලිය

## 2. පාපිෂ්ඨ ස්වභාවය පිළිගත් හා යටත්වූ සිත




2. පාපිෂ්ඨ ස්වභාවය පිළිගත් හා යටත්වූ සිත

මරණය'' බව ඔහුට දේව වචනය මතක්කර දී ''එක්වරක් මරණයත්, ඊට පසු විනිශ්චයත් ඇති බව පෙන්වා දෙයි'' (හෙබ්‍රෙව 9:27).ගෙන්දගම හා ගින්දරෙන් පිළිස්සෙන සදාකාල ගිනිවිල (අපාය) පව්කාරයාගේ කොටස වෙයි. එක් අතකින් දේවදූතයා හිස් කබලක්

ගෙන සිටියි. මෙය අප සැමදෙනම මිය යුතු බව පව්කරුට මතක්කර දීමටය. අප මෙපමණ ප්‍රේම කරන, සරසවන, පෝෂණය කරන හා අලංකාර කරන, තෘෂ්ණාවන්ගෙන් හා ආසාවන්ගෙන් පිරුන මෙම ශරීරය මැරී, කුණු වී පණුවන් විසින් විනාශ කරනු ලැබේ. නමුත් අපේ ආත්මය සදහටම ජීවත්ව, යම් දවසක දෙවියන්වහන්සේගේ විනිශ්චය ආසනය ඉදිරිපිට පෙනී සිටියි.

මෙහි පව්කරු දේව පණිවුඩය පිළිගෙන දෙවියන්වහන්සේගේ ප්‍රේමයට ඔහුගේ සිත විවෘතකර ඇත. දැන් ඒ අඳුරු සිතට ශුද්ධාත්ම ආලෝකය විහිදෙයි. තවද, දෙවියන්වහන්සේගේ ආලෝකය ශරීර–යට ඇතුළුව අන්ධකාරය පළවා හරියි. දෙවියන්වහන්සේගේ ආලෝකය පැමිණි විට, අන්ධකාරය පහවිය යුතුමය. එබැවින් නොයෙකුත් සතුන් ගෙන් නිරූපනය කළ පාපයන් පැන දුවයි. මෙය කියවන ප්‍රිය මිතුර, මිතුරිය, යේසුස්වහන්සේගේ ආලෝකයට ඔබ සිතට ඒමට ඉඩ හරින්න. එවිට මෙහි පෙන්නා තිබෙන පරිදි අන්ධකාරය හා අන්ධ–කාරයේ ක්‍රියා ඔබ සිතෙන් පලායයි. යේසුස්වහන්සේ මෙසේ කීසේක: ''මම ලෝකයේ ආලෝකයයි. මා අනුව එන්නා අන්ධකාරයෙහි නොහැසිර ජීවනයේ ආලෝකය ලබන්නේය'' (යොහන් 8:12). ඔබේ වෑයමෙන් හෝ මිනිස් නුවණින් හෝ ලොවැති කිසිම ධර්මයකින් හෝ කවර කලකවත් මෙම අඳුර සිතින් තුරන් කිරීමට නොහැකිය. යේසුස් වහන්සේගේ දීප්තිමත් ආලෝකයට ඔබ සිතට ඒමට ඉඩ දීමෙන්, ඉතා පහසු විශ්වාස, බලගතු එකම මාර්ගය සොයා ගන්නේය. එවිට පාපය නැමති අන්ධකාරය දුරු වී යයි. සඳ හා තරු අඳුරු රැයකදී අපට සුළුවෙන් උපකාර කරයි. නමුත් ඉර නැග ආ කළ අඳුර හා සුළු ආලෝකය අතුරුදහන් වෙයි. ධර්මිෂ්ඨකමේ හිරු නම් යේසුස්වහන්–සේය. එක් දිනක් උන්වහන්සේ යෙරුසලමේ මාලිගාවට ඇතුළුව, එහි සිටි සැම ගව, බැටළු හා පරෙවි වෙළඳුන් පලවා හැර මිළ මාරු කරන්නන්ගේ මේසද පෙරළා මෙසේ කීසේක: ''මාගේ ගෘහය යාඥා ගෘහයක්ය කියනු ලබන්නේය'' (මතෙව් 21:13). මෙලෙස දෙවියන්වහන්සේගේ ගෘහය හා මාළිගාව වන පිණිස ඔබ සිත වෙන්කර ඇත. උන්වහන්සේ මෙය අලංකාරයෙන් සරසා ආලෝකයෙන්, ප්‍රේමයෙන් හා ප්‍රීතියෙන් පූරවා මෙහි වාසය කිරීමට බලා සිටිති. පාපයට සම්පූර්ණ සමාව දී එයින් අප මුදා, එහි පාලනයෙන් හා බලයෙන් නිදහස් කිරීමට යේසුස්වහන්සේ පැමිණි සේක. ''එහෙයින් යේසුස්වහන්සේ නුඹලා නිදහස් කරනසේක් නම් සැබවින්ම නුඹලා නිදහස් වන්නහුය.'' (යොහන් 8:36)

# තුන්වන චිත්‍රය


සැබෑ ලෙස පසුතැවිලි වූ පව්කරුවෙකුගේ සිතකි මේ. ඔහුගේ පාපය උදෙසා යේසුස්වහන්සේ මැරුණු බව පෙනී, දේව වචනය

Copyright NWCP

නැමති දේව දූතයා අනාවරණය කරන කුරුසිය දැක ඒ පසුතැවිලි වූ සිත දූන් දුකින් හා වේදනාවෙන් බිඳී යයි. **දෙවියන්වහන්සේගේ ප්‍රේමය, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් පෙනෙන විට, මේ ප්‍රේමය ඔහුගේ සිත උණු කරයි.** විශේෂයෙන් මෙය වනුයේ දෙවියන්වහන්සේගේ පුත්‍ර වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔහුගේ පව් සඳහා සිය කැමැත්තෙන් සාපලත් කුරුසිය මත දිවි පිදීමටට කැමතිවූ බව ඒත්තු ගැනීමෙන් පසුවයි. අප පාප නිසා යේසුස්වහන්සේට කස පහර දී කටු ඔටුන්නක් පළඳා, අත් පා ඇණ ගසා මැරූ බව, පසුතැවිලි වන්නාවූ පව්කරු පිළිගත් විට, එම සිත හා ජීවිතය සම්පූර්ණයෙන් වෙනස් වෙයි. කැඩපතක් මෙන් ඇති දේව වචනය කියවන විට, දෙවියන්වහන්සේගෙන් ඈත්ව, උන්වහන්සේගේ පනත්වලට විරුද්ධව කොපමණ පව් කළාද යත් දූන් ඔහුට අවබෝධ වෙයි. ඔහු ගැඹුරු භක්තිමත් දුක් වේදනාවෙන්ද, කඳුළින් හා ඇඩීමෙන්ද දෙවියන්වහන්සේට තම සිත ගලා යන්න හරින විට, යේසුස්වහන්සේ ඔහුට ළංවනසේක. **දෙවියන්වහන්සේගේ පුත්‍ර යේසුස්වහන්සේගේ ලෙය සෑම පාපයකින්ම අප පවිත්‍ර කරන බව** (1 යොහන් 1:7) ඔහු ඒත්තු ගැනීමට පටන්ගත් කළ දෙවියන්වහන්සේගේ ප්‍රේමය හා සමාදනය ඔහුගේ සිතට ඇතුළ් වෙයි. ''ස්වාමීන්වහන්සේ බිඳුණු සිත් ඇත්තන්ට ළංව සිටිනසේක. තැළුණු ආත්ම ඇත්තන් ගළවනසේක'' (ගීතාවලිය 34:18). තවද දේව වචනය මෙසේද පවසයි: යටහත්වූ තැළුණු ආත්මයක් ඇත්තාවූ, මාගේ වචනයට වෙව්ලන්නාවූ මනුෂ්‍යයා දෙස බලමි'' (යෙසායා 66:2). යේසුස්වහන්සේගේ වචනය වන ''පුත (දුව) ධෛර්යමත් වෙන්න. නුඹේ පව් කමා කරන ලද්දේය'' ඔහුට (ඇයට) ශුද්ධාත්මයාණන්වහන්සේ කියනසේක. ඔහු කුරුසිය දෙස හා කුරුසිය මත හෙලූ යේසුස්වහන්සේගේ ලෙය දෙස නෙත් යොමා මෙය ඔහු උදෙසා කළ බව විශ්වාස කරන කළ, යේසුස්වහන්සේ අප වේදනාවන් උසුලා, දුක ඉවත ලා අප අපරාධ නිසා තුවාල ලද බවද, අප අයුතුකම් නිසා පොඩි කළ බවද, අප සියල්ලන්ගේම අයුතුකම් ස්වාමීන්වහන්සේ මත ගත් බවද ඔහුට අවබෝධ වෙයි. (යෙසායා 53)

දූන් ශුද්ධාත්මයාණන්වහන්සේ සහ දෙවියන්වහන්සේගේ ප්‍රේමය පිරිසිදු වූ සිත තුළ වාසය කරති. ඇදහිල්ලෙන් කුරුසිය දෙස හා යේසුස්වහන්සේ දෙස බලන කළ ඔහුගේ පාපවලට කමාව ලැබී ඇති බවටද දෙවියන්වහන්සේගේ පුත්‍ර වූ යේසුස්වහන්සේගේ ලෙය ඔහුගේ සියලු පාප සෝද ඇති බවටද සිතට ස්ථිර විශ්වාසයක් පැන නැගෙයි (1 යොහන් 1:7). යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අදහාගත් සියලුදෙනම විනාශ නොවී, ඔවුන් සදකාල ජීවනයට ඇතුල් වන බව දූන් ඔහුට විශ්වාසය (යොහන් 3:16). යේසුස්වහන්සේ තුළ ''උන්වහන්සේගේ ලෙය නිසා අපේ මිදීම වන අපේ වරදට

සමාව අපට ඇත්තේය'' (එපිස 1:7). ප්‍රථමයෙන් අපට ප්‍රේම කළ දෙවියන්වහන්සේට ප්‍රේම කිරීමට හා සේවය කිරීමට ඇති ගැඹුරු කැමැත්තට, දැන් ඒ පැරණි පව්කාර මාංසික තෘෂ්ණාව යටත්ව




## 3. පසුතැවිලි වෙන්නාවූ සිත

ඇත. එමනිසා ලෝකයට හා ලෞකික දෙයට ප්‍රේම නොකර දැන් ඔහු දෙවියන්වහන්සේට හා දෙවියන්වහන්සේගේ දෙයට පමණක් ඇළුම් කරයි.

නොයෙක් පාප පිළිබිඹු කරන සතුන්, දැන් සිතින් පිටත සිටින බව මෙහි පෙනෙන අතර, යක්ෂයා තම ප්‍රථම වාසස්ථානය හැර යාමට අකමැතිව නැවතත් ඇතුල්වීමේ බලාපොරොත්තුවෙන් ආපසු හැරී බලයි. එබැවින් අවදිව යාඥා කරන ලෙසද, යක්ෂයා පලායන පරිදි ඔහුට විරුද්ධව සිටින ලෙසද, යේසුස්වහන්සේ අපට අවවාද කරනසේක.

# සතරවන චිත්‍රය


අපගේ ස්වාමීන් හා ගැලවුම්කරු වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පූජාව තුළින් පාපයෙන් මිදී සාමයෙන් පූර්ණ වූ මිනිසෙකුව මෙහි පෙනෙයි. දැන් ඔහු කිසිසේත් උඩඟු නොවී, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කුරුසිය ගැන මිස, වෙන දෙයක් ගැන පාරට්ටුවකර නොගෙන, එය තුළින් ලෝකය ඔහුටද, ඔහු ලෝකයටද ඇණගසනු ලැබ සිටියි'' (ගලාති 6:14).''අප පාපවලට නැසී, ධර්මිෂ්ඨකමට ජීවත්වන පිණිස'' (1 පේතෘස් 2:24) යේසුස්වහන්සේ කුරුසිය මත මළේය. එබැවින් ඔබ ලෝකයට ඇණගැසූ මිනිසෙකු විය යුතුයි. ''ආත්මයාණන් තුළ ඉපිද, මාංසික තෘෂ්ණාවන් පහ කරන මෙන් අපට අණකර තිබේ.'' (ගලාති 5:16 හා 25).

ස්වාමිවූ යේසුස්වහන්සේගේ ඇඳුම් ගළවා, උන්වහන්සේව බඳින ලද ඒ කනුව සහ ඉතා කෲර ලෙස පහරදීමට පාවිච්චි කළ කසද මෙහි ඇත. අප පාප නිසා උන්වහන්සේ මෙම කස පහරවලට ලක් විය. ''අපට සාමය ගෙන දෙන දඬුවම උන්වහන්සේ පිට තැබුසේක.'' හෙරොද් සහ ඔහුගේ අනුගාමිකයින් උන්වහන්සේට සරදම්කර රන් ඔටුන්නක් වෙනුවට කටු ඔටුන්නක් හිස මත තබා තද කළහ. රාජ්‍යය බලයේ ලාංඡනය වෙනුවට, දකුණත බට දණ්ඩක් තබා උන්වහන්සේට හිස නමා ''යුදෙව්වන්ගේ රජ'' මෙන් ආමන්ත්‍රණය කරමින් කවටකම් කළෝය. එයින් සෑහීමකට පත් නොවූ ඔවුහු යේසුස්වහන්සේට කෙළ ගසා බට දණ්ඩෙන් හිසට පහරදී සියලු ලැජ්ජාවටත් නින්දාවටත් පත්කර ඉතාමත් කෲර ලෙස සරදම්කර, කුරුසියේ ඇණගැසීම පිණිස ගෙන ගියහ.

අද බොහෝ දෙන ක්‍රිස්තියානි නම දරා දේවස්ථානවල යාඥා කරමින් හා රාත්‍රි භෝජනයට සහභාගිවෙමින් දෙවියන්වහන්සේ ගැන ගී ගයමින් ජීවත්වෙන මුත්, පරිසි ආත්මයෙන් පිරුණු ඔවුන්ගේ පාපිෂ්ඨ ක්‍රියා සැමවේලේම ගැලවුම්කරුව ඇණගසති. ''ස්වර්ගයේ සිටින මාගේ පියාණන්වහන්සේගේ කැමැත්ත කරන්නා මිස, මට ස්වාමිනි, ස්වාමිනි කියන සියල්ලෝම ස්වර්ග රාජ්‍යයට ඇතුල් නොවන්නෝය. (මතෙව් 7:21 – 27)

Copyright AMGP

ස්වාමිවූ යේසුස්වහන්සේව රිදී මිළ තිහකට විකුණා, උන්වහ-න්සේව පාවා දුන් යුදස්ගේ මුදල් පසුම්බියද මෙහි පෙන්වා ඇත. මුදලට ඇති තණ්හාව ඔහුගේ සිත තරණයකර මනස අන්ධ




## 4. යේසුස්වහන්සේ සමග කුරුසියේ ඇණ ගසනු ලැබීම

කළේය. යේසුස්වහන්සේව සිරභාරයට ගත් රාත්‍රියේදී, සොල්දා-දුවන් පාවිච්චි කළ ලන්තැරුම හා දම්වැල් යනාදිය ද මෙහි වෙත්. තවද දෙවියන්වහන්සේගේ අනාගතවාක්‍යය සම්පූර්ණ කරමින්

සුදුව සඳහා පාවිච්චි කරන දදු කැටය ගෙන උන්වහන්සේගේ වස්ත්‍රය අයිති කරගැනීමට සොල්දාදුවෝ දදු දමූහ. ''මාගේ වස්ත්‍ර ඔවුහු අතර බෙද ගනිති. මාගේ සළුව සඳහා දදු දමති'' (ගීතාවලිය 22:18). ඔවුහු යේසුස්වහන්සේව ප්‍රතික්ෂේපකර ''මොහු අපව පාලනය කරන්ට ඕනෑ නැත'' කියා උන්වහන්සේගේ සියල්ල ගත්හ. දෙවියන්වහන්සේගේ සම්පූර්ණ පාලනයට යටත් නොවී, උන්වහන්සේගේ ආශිර්වාද හා ලාභ ප්‍රයෝජන පමණක් අද මිනිසාට ඕනෑ වෙයි. නමුත් කරදරවලදී හා බලාපොරොත්තු නැති වූ විට පමණක් දෙවියන්වහන්සේව සොයති. ඔබත් මෙලෙසද?

හෙල්ල ගත් හේවායෙක් උන්වහන්සේගේ ඇළයට හා හෘද යට ඇන්න බැවින්, ''එකෙණෙහිම ලෙයත් වතුරත් නික්මුණේය'' (යොහන් 19:33-37). කුකුළා හඬලන්ට ප්‍රථම පේතෘස් උන්වහන්සේව තුන්වරක් නාඳුනමියි කී නමුත් පසුව ඔහු පසුතැවිලි වී ඉවසිය නොහැකි සිත් වේදනාවෙන් හඬා වැලපුණි. ඔබ යේසුස්වහන්සේ ගැන අන්‍යයන්ට වචනයෙන් හා ක්‍රියාවෙන් සාක්ෂි දරනවාද නැතහොත් මනුෂ්‍යයන් ඉදිරිපිට එසේ කිරීමට ලැජ්ජා වෙනවාද? යේසුස්වහන්සේ මෙසේ කීසේක: මනුෂ්‍යයන් ඉදිරියෙහිදී ''ඔහු අඳුනමි''යි මා ගැන කියන යමෙක් ඇද්ද, ස්වර්ගයෙහි සිටින මාගේ පියාණන්වහන්සේ ඉදිරියේදී මමත් ''ඔහු අඳුනමි''යි කියන්නෙමි. නමුත් මනුෂ්‍යයන් ඉදිරියෙහිදී ''ඔහු නාඳුනමි''යි මා ගැන කියන යමෙක් ඇද්ද, ස්වර්ගයෙහි සිටින මාගේ පියාණන්වහන්සේ ඉදිරියෙහිදී, මමත්: ''ඔහු නාඳුනමි''යි කියන්නෙමි'' (මතෙව් 10:32 — 33). ''තමාගේ කුරුසිය රැගෙන මා අනුව නොඑන තැනැත්තා, මට සුදුසු නොවේ'' (මතෙව් 10:38). ඇත්තෙන්ම යේසුස්වහන්සේ නැමති පර්වතය මත සිටින තැනැත්තා ආශිර්වාද ලද්දෙකි.

''මට විවර ගල—සැඟවෙමි ඔබ තුළ
ගැලූ ඔබගේ ඇලෙන්—වතුර හා රුදිරෙන්
මා පව් හා එහි බලේ—සෝද හරින් මෙකලේ.''

## පස්වන චිත්‍රය


දෙවියන්වහන්සේගේ අධික කරුණාවෙන් හා දයානුකම්පාවෙන් පිරිසිදු වූ පව්කරුගේ සිත මෙහි පෙනෙයි. ''යමෙක් මට ප්‍රේම කරන්නේ නම්, ඔහු මාගේ වචනය රක්ෂා කරන්නේය. මාගේ පියාණන්වහන්සේද ඔහුට ප්‍රේම කරනසේක. අපි ඔහු ළඟට පැමිණ, ඔහු සමග වාසය කරන්නෙමුව'' (යොහන්

14:23). මෙම පොරොන්දුව අනුව ඒ සිත දෙවියන්වහන්සේගේද, පුත්‍රයාණන්වහන්සේගේද, ශුද්ධාත්මයාණන්වහන්සේගේද, සැබෑවූ ගෘහය වී ඇත. යේසුස්වහන්සේ තුළින් දෙවියන්වහන්සේ මනුෂ්‍ය-යාට ගෞරවයෙන් ආශිර්වාදකර ඔහුව ඔසවනුසේක (ලූක් 1:52).

දැන් මේ සිත දෙවියන්වහන්සේගේ සැබෑවූ මාළිගාව වී පාපය පලවා හැර ඇත. බොරුවේ පියා වන යක්ෂයා විසින් පාලනය කරනු ලබන සතුන් වෙනුවට, සත්‍යයේ ආත්මය වන ශුද්ධාත් මයාණන්වහන්සේ සිතෙහි වාසය කරති. පිළිකුල් වූ පාපයේ ආසනය වෙනුවට දැන් මේ සිත ඉතා අලංකාර ඵල දරන ගසක් වී ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල වන ප්‍රේමය, ප්‍රීතිය, සමාදනය, යහපත්කම, ඉවසිලිවන්තකම, කරුණාවන්තකම, විශ්වාසකම, මෘදු-කම, පමණ දන ක්‍රියා කිරීම හා වෙනත් යහපත් දෙයින් පිරී දෙවියන් වහන්සේ හා මිනිසා ඉදිරිපිට යහපත්ව පවතයි. දැන් ඔහු සැබෑ මිදි වැල නැමති අප ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඵලින් බර අත්තක් වී ඇත. මෙම ඵල දැරීමේ රහස නම්, ඔහු උන්වහන්සේ තුළත් උන්වහන්සේගේ වචනය ඔහු තුළත් පැවතීමය (යොහන් 15:1 – 10). තවද ඔහු ශුද්ධාත්මයාණන්වහන්සගෙන් බෞතිස්ම වී මාංසික තෘෂ්ණාවල් පරාජයකර, පැරණි මිනිසා ඇණ ගසා, ශුද්ධාත්ම යාණන්වහන්සේගේ බලයෙන් මාංසයෙන් ජයගෙන, ආත්මය තුළ ගමන් කිරීමට ඔහුට දුන් බලය තිබේ. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇති ඇදහිල්ල ලෝකයෙන් ජය දුන් නිසා ඔහු දැන් ජීවත්ව-නුයේ පෙනෙන ඇසෙන හැඟෙන දෙයින් නොව, නුමුත් ඇදහිල්-ලෙන්ය. උන්වහන්සේ තුළ ඇදහිල්ල — ලෝකයෙන් ජය දෙයි. විශ්වාස වූ ජීවමාන බලාපොරොත්තුවකින් හා යේසුස් ක්‍රිස්තුස්-වහන්සේගේ නැවත ඊමේ තේජාන්විත බලාපොරොත්තුවෙන් ශක්ති සම්පන්නව, දෙවියන්වහන්සේගේ සදකාලික ප්‍රේමය තුළ ඔහු නිරතුරුව ජීවත් වෙයි.

“සිතින් පවිත්‍රව සිටින්නෝ ආශිර්වාද ලද්දෝය. මක්නිසාද ඔවුහු දෙවියන්වහන්සේ දකින්නෝය.” (මතෙව් 5:8). පිටස්තර සතුරන්ගෙන් කොපමණ ජය ගත්තත්, කොපමණ ධනය තිබුනත්, ලොකුම යුද්ධය, තම සිත සමග බව දාවිත් රජ දැන සිටි යේය. මෙහි ඇති ගැඹුරු වුවමනාවන් ඒත්තු ගත් ඔහු මෙසේ යාඥා කළේය: “දෙවියන්වහන්ස, පවිත්‍ර සිතක් මා තුළ මැවුව මැනව; ස්ථිර ආත්මයක් මා තුළ අළුතෙන් සෑදුව මැනව” (ගීතාවලිය 51:10). කිසි කෙනෙකුට තම සිත පිරිසිදු කරගැනීමට හෝ අළුත් සිතක් මවා ගැනීමට නුපුළුවන. එමනිසා දවිත් රජමෙන් අවංකව පසුතැවිලි වී දෙවියන්වහන්සේගෙන් අළුත් සිතක් ඉල්ලන්න. උන්වහන්සේ කවර කලවත් ඔබව හිස් අතින් නාරිති. විශ්වාස

කරන්න—ඔබ ජීවිතයට සමාදනවත් නව රුවන්මය සමයක් ගෙන දීමට දෙවියන්වහන්සේ කැමැත්තෙන් සිටිති! හිස් පොරොන්දුවලින් හා ඉල්ලීම්වලින්, ඉරී ගිය තම ධර්මිෂ්ඨකම නැමති වැරහැලි වස්ත්‍රයට




## 5. දෙවියන්වහන්සේගේ මාලිගාව

අණ්ඩ දැමීමෙන් දෙවියන්වහන්සේගේ වාසයට ඔබ සිත සුදුසු නැත. උන්වහන්සේ ඔබට උදව් කිරීමට ඉතා කැමැත්තෙන් සිටින නිසා මෙසේ පොරොන්දු වී ඇත: ‘‘නුඹලා පිරිසිදු වන පිණිස මම නුඹලා මත පිරිසිදු දිය ඉසින්නෙමි; නුඹලාගේ සියලු අපවිත්‍ර-

කමින්ද, සියලු රූප ඇදහීමෙන්ද නුඹලා පිරිසිදු කරන්නෙමි. මම අළුත් සිතක් නුඹලාට දී, අළුත් ආත්මයක් නුඹලා තුළ තබා, මාංශයෙන් ගල් සිත පහකොට, මා සමය වූ සිතක් දෙන්නෙමි. මාගේ ආත්මය නුඹලා තුළ තබා, නුඹලා මාගේ පනත් ප්‍රකාර හැසිර, මාගේ විනිශ්චයන් පවත්වමින් ඒවා කරන්ට සලස්වන්නෙමි'' (එසකියෙල් 36:26 – 27). දෙවියන්වහන්සේ තම පුත්‍ර වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ලෙයින් මුද්‍රණය කළ අළුත් ගිවිසුමේ තේරුම මෙයයි.

නැවතත් දේව දූතයා මෙහි පෙනී සිටියි. සදාකාල ජීවනය උරුමකර ගන්නන්ට උපස්ථාන කිරීමට හා දෙවියන්වහන්සේට බිය ඇත්තන් වටලා කඳවුරු බැඳ සිටීමට දේවදූතයන් පත්කර ඇත. (ගීතාවලිය 34:7; 91:11; දානියෙල් 6:22; මතෙව් 2:13; 13:39; 18:10; ක්‍රියා 5:19; 12:7 – 10).

අවසථාවක් ලැබූ වහාම නැවත ප්‍රථම වාසස්ථානයට ඇතුල්වීමට අවස්ථාවක් බලමින්, යක්ෂයාද සිතට ළංව සිටියි. ''සිහි ඇතිව අවදිව සිටින්න. අප විරුද්ධකරු වන යක්ෂයා ගොරවන සිංහයෙකු මෙන් කවරෙකු ගිලිමිඳූයි කියා ඔබ මොබ ඇවිදියි'' (1 පේතෘස් 5:8) එමනිසා අපට අවදිව යාඥා කරන මෙන් අවවාදකර තිබේ. ආරක්ෂා නොවී සිටින තෝරාගත් සාන්තුවරයන්ව, මෙලොව ලෞකික තෘෂ්ණා වලින් රැවටීමටද, කපටිකමින් මුළා කිරීමටද, යක්ෂයා සැමවිටම ආලෝකයේ දූතයෙක් මෙන් වෙස් වළාගෙන ඇත. මොහුට අප විරුද්ධ වූ විට ඔහු අප කෙරෙන් පලා යයි (යාකොබ් 4:7).

# භයවන චිත්‍රය

මෙය පසුබට වූවකුගේ දුක්ඛිත චිත්‍රයෙකි. ඔහුගේ ක්‍රිස්තියානි ජීවිතය නිදිමතව නිවීයන හෙයින් ඇසක් වැසීගෙන යයි. අනෙක් ඇස, කිසිම ලජ්ජාවක් නොමැතිව වටපිට බලමින් ලෝකයට ප්‍රේම කරන නිසා ඇතුළත ආලෝකය අඳුරු වී යයි. වටපිට ඇති පරීක්ෂා දුරු කිරීමට මැලි වූ ඔහු, ක්‍රම ක්‍රමයෙන් ඒවාට අවනත වී ඇති නිසා යේසුස්වහන්සේ සමග දුක් විඳීමට පවා තිබූ ඒ තේජාන්විත කැමැත්තද දූන් බිඳ වැටී ඇත.

දෙවියන්වහන්සේගේ වචනයට සවන් නොදී දූන් ඔහු යක්ෂයාගේ කපටි යෝජනාවලට හා හිස් පොරොන්දුවලට වහල් වෙයි. ඔහුගේ ලෞකිකත්වය, ආගම නැමති වස්ත්‍රයෙන් වසාගෙන පල්ලි යන්නෙක් වුවද, දෙවියන්වහන්සේගේ ප්‍රේමය සිතින් නිවී ගොස්, මත දෙකක්

Copyright ANCF


මැද සිත් දෙකකින් පෙනී ලෝකයට ආලය කරමින්, දෙවියන්වහන්-සේට ප්‍රේම කරන බව ලෝකයාට හඟවයි. තවද හෘදසාක්ෂිය නැමති තරුව අඳුරු වී ඇත. සිනහවක් සමග කුරුසිය උසුලා නොගෙන, දැන් එය ආරාධනා නොකළ මහත් බරක් බවට පත්ව, ඇදහිල්ල සෙලවී යාඥාවෙන් දෙවියන්වහන්සේ සමග තිබූ සබඳකමද නවතා ඇත. තම සිතෙහි තත්ත්වය ගැන කිසිම සැලකිල්ලක් නොවී, පිටත සිට පාපයට පොළඹවන යක්ෂයාට ක්‍රම ක්‍රමයෙන් සිත්හි ඉඩදී සැබෑ ඇදිහිලිවන්-තයන්ට වඩා ඔහු ලෞකික මිතුරන් ඇසුර ප්‍රිය කරයි.

ආඩම්බරය නැමති මොනරාගේ ආත්මය සිත තුළට පිවිසීමට මන් බලමින් සිටිනාතර බෙබදුකමද සිත නැමති දෙරට තට්ටුකර ඇතුළ්වීමට තැත් කරයි. තමා ගළවනු ලැබුවේ කරුණාවෙන් බව අමතක කළ ඔහු, දැන් උඩඟු කිතුනුවෙකු වෙයි. විශේෂ අවස්ථාවල ලෞකික මිතුරන් ඇසුරේදී පමණක්, තමා අමුතු හෝ දුර්වල හෝ සමාජයෙන් තොර කෙනෙකු හෝ නොවී, ඒ එක් අවස්ථාවේදී පමණක් මත්පැන් ගැනීමෙන්, ඔහුගේ ආත්මික ජීවිතයට උපද්‍රවයක් නොවන බව යක්ෂයා පවසයි. මේ සමග කාම සිතිවිලිද, තණ්හාද ඔහුගේ සිතට දනෙයි. දැන් ඔහු දුශ්ශීල විහිළු භුක්ති විඳීමට පටන් ගෙන එම පහත් චිත්‍ර දෙස සතුටින් බැලීමට ආසා වී එයාකාර මිතු-රන් ආශ්‍රය ප්‍රිය කරයි. තවද යක්ෂයාගේ සෑම යෝජනාවක්ම ගිල ගනිමින් නැටුම් ශාලාවලද, ප්‍රශ්න කළ හැකි විනෝදවලද හැසි-රෙයි. මේවා සොබාදහම බවත්, එක් පාපයක් කිසිසේත් පාපයක් නොවෙන බවත් පවසා යක්ෂයා ඔහුව රවටයි.

නපුරු වනචාරී කුරුල්ලන් මෙන් අපිරිසිදු සිතුවිලි අප හිස ඉහළින් පියාසර කිරීම අපට නැවැත් විය නොහැක. නමුත් අප වරද කරුවන් වනුයේ, මේවාට සිතේ කුඩු සාද, නපුරු ක්‍රියා රකින්ට ඉඩ දුන් විටය. සුළහිල්ල යක්ෂයාට දුන් විට, ඔහු මුළු අතම තදින් අල්ලා, ආත්මයද, ප්‍රාණයද සදකාල අපායට ඇදගනියි. එමනිසා දෙවියන් වහන්සේගේ විශේෂ අවවාදය නම්: ''යෞවන තෘෂ්ණාවලින් පැන දුවන්න. පාපය කුමන වේශයකින් පැමිණියත්, ඒ සමග සෙල්ලම් නොකර, ඔබව නිදහස් කරන එමෙන්ම ඔබට ජය දෙන යේසුස්-වහන්සේ වෙතට දුව යන්න'' යනුයි.

ක්‍රිස්තියානි ආගමට පටහැනිව සරදම් කරන්නන්ව පිහියකින් අනින මිනිසාගෙන් පෙන්නා තිබේ. ඔවුහු, නින්ද අපහාස දිව්වලින් හා සරදම් තොල්වලින් ක්‍රිස්තියානිකරුගේ සිතට ඇන තුවාල කරති. බෙදුනු සිතට මෙම පහරදීම් මධ්‍යයෙහි විසීමට බැරිය. එමනිසා දැන් ඔහු දෙවියන්වහන්සේට වඩා මිනිසාගේ පරුෂ වචනවලට හා නපුරු ක්‍රියාවලට භය වී, ඔහුට වහලෙක්ව, දෙවියන්වහන්-

සේගෙන් ඈත්ව ජීවත් වෙයි. කරදර කාලවලදී හා බලාපොරොත්තු සුන්වූ අවස්ථාවලදී උදහස හා කෝපය බලහත්කාරයෙන් ඇතුල්




6. පරික්ෂාවට පත්වූ හා බෙදුණු සිත

වීමට මාන බලයි. අන්‍යයන් දියුණු වී වාසනාවන්තව සිටින කළ, නපුරු නයා පැමිණ, නොදැනුවත්ව රිංගා වෛරයට හා උඩඟුවට දොර විවෘත කරයි.

ස්වාමිවූ යේසුස්වහන්සේගේ 'අවවාදය පිළිනොගත් කළ මුදලට ඇති ආලය අප සිතට පහසුවෙන්ම ඇතුල් වෙයි. උන්-වහන්සේ කියනසේක්: නුඹලා පරීක්ෂාවට නොපැමිණෙන පිණිස අවදිව යාඥා කරන්න (මතෙව් 26:41). එහෙයින්, තමා කෙළින් සිටින්නේ යයි කියන තැනැත්තේ නොවැටෙන්ට බලාගනිත්වා'' (1 කොරින්ති 10:12). යක්ෂයාගේ උපායන්ට විරුද්ධව සිටීමට දෙවියන්වහන්සේගේ සම්පූර්ණ යුධ ඇඳුම අප පැළඳ ගත යුතුය (එපීස 6:11—18).

# හත්වන චිත්‍රය

පසුබටවූ මිනිසෙකුගේ සිතක් මෙහි දක්වෙයි. වරක් ඔහු සත්‍යයෙන් සැරසී ස්වර්ගීක දීමනාවන් රස බලා ශුද්ධාත්මයාණන් සමග පංගුකාරයෙකුව සිට දූන් වැටී ඇත. තවද, ''සුබ ආරංචිය'' නැමති බයිබලයේ සත්‍යතාවයන් පහද දූන් නමුත් කිසි කලකත් පසුතැවිලි නොවූ හෝ දෙවියන්වහන්සේට භාර නොවූ මිනිසෙකුගේ සිතේ තත්ත්වයද මෙයින් පෙන්වයි. දෙවියන්වහන්සේගේ ඉල්ලීම අහක ලා සිත තද කරගන්නා මිනිසා තම උත්සාහයෙන් යහපත්වීමට කොපමණ වෑයම් කළත්, ඔහු තව තවත් නපුරේ ගැඹුරටම ගිලා බසියි.

පසුබටවූ තැනැත්තාගේ තත්ත්වය යේසුස්වහන්සේම මෙසේ විස්තර කරති: ''අශුද්ධාත්මය මනුෂ්‍යයාගෙන් දුරුව ගිය කළ, නිවාඩු සොයමින් දිය නැති තැන්වල ඇවිද, එය නොලැබුනු බැවින් ඔහු කථාකර: මම පිටත්ව ආ මාගේ ගෙට හැරී යමියි කියයි. ඔහු එහි පැමිණි කළ එය අතුගා සරසා තිබෙනවා සම්භවේ. එවිට ඔහු ගොස්, තමාට වඩා නපුරුවූ වෙන ආත්මයන් සත් දෙනෙකු තමා කැටුව ගෙන එන්නේය; ඔවුහු ඇතුල්ව වාසය කරති. එවිට ඒ මනුෂ්‍යාගේ පළමු ස්වභාවයට වඩා අන්තිම ස්වභාවය නපුරු වන්නේය'' (ලූක් 11:24—26). බල්ලා නැවත උගේ වමනයටත්, නැවා වූ ඊරි මඩේ පෙරළීමටත් හැරී ගියෝය යන සැබෑවූ උපමාවේ ප්‍රකාරයට ඔවුන්ට සිදුවී තිබේ. (2 පේතෘස් 2:22)

පහත ඇති බයිබල් පදය පසුතැවිලි නොවූ පව්කරුවෙකුගේ තත්ත්වය පැහැදිලිව විස්තර කරයි—පාපය, සිතේ විසීමට හා සිත පාලනය කිරීමට සියලු රැවටිලිකාරයෙන් නැවත පැමිණ සිටියි. ඔහුගේ මුහුණ යම්කිසි ප්‍රමාණයකට සිතේ තත්ත්වය පෙන්වා දෙයි. පාපය ඇති නිසා ශුද්ධාත්මයාණන්වහන්සේ නැමති ඒ මෘදු පරෙවියා දූන් සිත අතහැර යති. ඊට හේතුව නම් පාපයටත් ශුද්ධාත්මයාණන්-

වහන්සේටත් එකට වාසය කිරීමට නොහැකි බැවිනි. තවද එකවිටම දෙවියන්වහන්සේගේ ගෘහය මෙන්ද, යක්ෂයාගේ ගුහාව මෙන්ද සිතට විසීමට නොහැකි නිසාය. ඔහු හෝ ඈ අකීකරු පුත්‍රයා මෙන් පසුතැවිලි වෙයි යනු බලාපොරොත්තුවෙන් දේව වචනය නැමති දේව දූතයා ආපසු හැරී බලමින්, ඉතා දුකෙන් ඉවත්ව යයි. අකීකරු පුත්‍රයාගේ කථාවෙහි කොටසකි මේ: "ඔහු ඌරු කෑමෙන් තම කුස නිවාගැනිමට කැමති විය. කිසිවෙක්ද ඔහුට කිසිවක් නොදුන්නේය. ඔහු සිහි උපදවා කථාකර: මම නැගිට මාගේ පියාණන් වෙත ගොස්, පියාණනි, ස්වර්ගයට විරුද්ධවද ඔබට විරුද්ධවද පව් කෙළෙමි; තවත් ඔබගේ පුත්‍රයා කියනු, ලබන්ට නොවටිමි"යි කියමි. (ලූක් 15:11—25). පශ්චාත්තාප වූ පුතු දුටු කළ, පියා ඔහුට සමාව දී නැවතත් බාර ගත්තේය.


සැබෑ පසුතැවිලිවීමක හෝ දෙවියන්වහන්සේ වෙත හැරී ඒමේ හෝ යේසුස්වහන්සේගේ පාමුල සිට කමාව අයදීමේ කිසිම ලකුණක් හෝ මෙම සිතෙහි නොපෙනෙයි. ඔහුගේ හෘද සාක්ෂිය රත්වූ යකඩයකින් හිල්කර නිෂ්ශබ්ද කළාක් මෙනි. ඔහුට කන් ඇති මුත් යේසුස්වහන්සේගේ කන්නලව් කිරීමේ හඬ නෑසෙයි; ඇස් ඇති මුත් අපාය පා ළඟ සිට ඇනුම් අරිනවා නොපෙනෙයි. නිතර පාපයේ ජීවත්වීමටද ලැජ්ජා නොවෙයි. ඔහුගේ සිත නැමති සිංහාසනයේ ඉඳගත් යක්ෂයා ඔහුව පාලනය කරයි. දැන් සුදු හුණු ගෑ සොහො-නක් මෙන් සිටින ඔහු පිටතින් ආගමික බැල්මක් ඇතිව, තමාගේ පිටස්තර පිරිසිදුකම ගැන හා නම්බුකාරකම ගැන පුරසාරම් දොඩයි. නුමුත් ඇතුළත මිනී කටුවලින්ද, සියලු අපවිත්‍රකමින්ද පිරී ඇත. (මතෙව් 23:27)

දැන් බොරුවේ පියා සැබෑවේ ආත්මයාණන්වහන්සේගේ ස්ථානය අත් කරගෙන ඇති නිසා සෑම සතෙක් හා පාපයක්ම විශේෂ යක්ෂයෙක් හා අශුද්ධ ආත්මයක් සමග සිතෙහි වාසය කරති. මෙම නීච වධ වේදනා කාරයන්ගෙන් නිදහස්වීමට ඔහු තැත් කරතත්, මෙවාට ඔහුව තදින් බැඳ ඇත. "මෝසස්ගේ ව්‍යවස්ථාව කඩ කළ අය, දෙදෙනෙකුගේ හෝ තිදෙනෙකුගේ සාක්ෂිය අනුව කිසිම කරුණාවක් නොලැබ මරණු ලැබිය. දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් පාගා දමා, තමාව පිරිසිදු කළ ගිවිසුමේ ලෙය අශුද්ධ දෙයක් ලෙස සිතා, අනුග්‍රහයේ ආත්මයාණන්වහන්සේට අපහාස කළ තැනැත්තා ඊට වඩා කොපමණ මහත් දඬුවමකට සුදුස්සෙක් ලෙස ගණන් ගනු ලබන්නේද? (හෙබ්‍රෙව් 10:28—29:2 පේතෘස් 2:1 – 14)

ප්‍රිය මිතුර, මෙම චිත්‍රය ඔබගේ සිතෙහි තත්ත්වය සමග සම් බන්ධ නම්, ප්‍රමාද නොවී, ඔබ සිත පත්ලෙන් දෙවියන්වහන්සේට

Copyright ANGP

දූන්ම බැගෑපත්ව කන්නලව් කරන්න. **ඔබව සම්පූර්ණයෙන් ගැළ-වීමට උන්වහන්සේට පුළුවන.** ඔබ සැබෑ ලෙස පසුතැවිලි වූ අවංක ආත්මයකින් පැමිණි විට, උන්වහන්සේ ඔබේ සෑම පාපයකටම සමාව




## 7. පසුබටවූ හෝ තද කරගත් සිත

දෙති. ඔබ උන්වහන්සේට අවසර දෙන්නෙහි නම්, ඔබේ සිතෙන් යක්ෂයාව හා සෑම අන්ධකාරයේ සේනාවන් එලවා දූමීමට උන්-වහන්සේ සූදනම්ව සිටිනසේක.

යේසුස්වහන්සේ වෙතට පැමිණි කුෂ්ඨ රෝගියා මෙන් ඔබත් පැමිණ මෙසේ කියන්න: ''ඔබ කැමතිසේක් නම් මා පවිත්‍ර කරන්ට ඔබට පුළුවන.'' එවිට යේසුස්වහන්සේ උත්තර දෙමින්: ''කැමැත් තෙමි, පවිත්‍ර වෙන්න'' කියා කියනසේක (මාර්ක් 1:40–41). නමුත් සිත තද කරගනිමින්, ආලෝකයට වඩා අඳුරට ප්‍රේම කරත් නම් ඔබම ජීවනය වෙනුවට මරණය තෝරාගනියි. එවිට ඔබට කිසිම බලාපොරොත්තුවක් හෝ පිහිටක් නොමැත. ''පාපයේ කුලිය මරණ යයි.'' (රෝම 6:23)


# අටවන චිත්‍රය

සැමදෙයම කල් දමමින් සිත තද කරගත් පව්කරුවෙකුව මෙහි පෙනෙයි. ඔහුගේ ශරීරය වේදනාවෙන්ද, ආත්මය මරණ බියෙන්ද පිරී ඇත. මරණය(ඇට සැකිල්ල) බලාපොරොත්තු නොවූ හා වුවමනා නොවූ වේලාවක පැමිණ තිබෙන නිසා පාපයේ රැවටිලිකාර විනෝද-යන් අවසාන වී, සත්‍යයවූ පාපයේ භයානක කුලිය වන මරණයට මුහුණ දීමට සිදුවී ඇත. දැන් අපායේ වධ වේදනා තම සිරකරු අල්ලා ගනියි. මෙපමණ කලක් දෙවියන්වහන්සේගේ ප්‍රේමයට පයින් ගැසූ ඔහු දැන් යාඥා කිරීමට වෑයම් කළත් දෙවියන්වහන්සේ සමග සහභාගිකම් පැවැත්වීමට බැරි බව ඔහුටම වැටහෙයි. ඔහුගේ පරම මිතුරන් මරණ ඇඳ ළඟ සිටීමට බිය වෙති; ඔවුන්ගේ සැනසිලිකාර වචනවලට උදව් කිරීමටද නුපුළුවන. වංචාවෙන් සොයාගත් ධනයට, ඔහුගේ ජීවිත කාලය දිගු කිරීමටවත්, ආත්මය බේරාගැනී මටවත්, ආත්මයේ වේදනාවෙන් ඔහුව ගලවා ගැනීමටවත් කිසි-සේත් නුපුළුවන. යක්ෂයා අවස්ථාවක් නොදෙන නිසා දෙවියන් වහන්සේ ගැන මෙනෙහි කිරීමටද අපොහොසත් වෙයි.

Copyright AMGP

ඔහු දෙවියන්වහන්සේගේ කරුණාව පයින් පෑගූ නිසා නීතියේ වරදට පත්ව සිටියි. ලෞකික දෙයට ප්‍රේමකර, ඒ උදෙසා ජීවත්වුන නමුත්, දැන් එම දේවල් ඔහුටම කවටකම් කරයි. කිසිම විශ්වාසයක් හා භක්තියක් නැති එම එඬේරාටද උපකාර කිරීමට නොහැකිය. ''ජීවමාන දෙවියන්වහන්සේගේ අත්වලට හසුවීම භයානක දෙයක්'' (හෙබ්‍රෙව 10:31) බව ඔහුට වැටහෙයි. දෙවියන්වහන්සේ සමග සහභාගිකම් පැවැත්වීම පිණිස පහසු දිනයක් හෝ මරණ ඇඳ බලාපොරොත්තු වී සිටි මුත්, දැන් එම අවස්ථාව සම්පූර්ණයෙන්ම නැති වී ඇත. දෙවියන්වහන් සේව සොයාගැනීමට කිසිම අවස්ථාවක් නොලැබ දහස් ගණනින් හදිසියේම මරු වැළඳ ඇත. එමනිසා දෙවියන්වහන්සේ සම්භවීමට හැකි අවස්ථාවේදී උන්වහන්සේව සෙවීම ඉතාමත් වැදගත්ය. තම ජීවිත කාලයේදී දෙවියන්වහන්සේගේ කරුණාව හා ප්‍රේමය ප්‍රතික්-

ෂේප කළ මෙම මරණාසන්න පව්කරුට, එද ගැළවුම්කරු වී සිටි යේසුස්වහන්සේගේ සැනසිලිකාර ගැළවීමේ වචන වෙනුවට අද විනිශ්චයකරු වී සිටින උන්වහන්සේගේ මෙම වදන් ඔහුට ඇසෙයි:




## 8. පව්කාරයාගේ විනාශය

**‘‘සාප ලත්තෙනි, මා කෙරෙන් පහව, යක්ෂයාටත් ඔහුගේ දූතයන්ටත් සූදානම්කර තිබෙන සදකාල ගින්නට යත්වා’’ (මතෙව් 25:41).**
**‘‘තවද එක්වරක් මරණයත් ඉන්පසු විනිශ්චයත් මනුෂ්‍යයන්ට නියම කර ඇත.’’ (හෙබ්‍රෙව් 9:27)**

# නවවන චිත්‍රය

අන්තිමය දක්වා බලවත් බාද පරීක්ෂාවලින් ජය ගනිමින් ජීවත් වන ක්‍රිස්තියානිකරුවෙකු මෙම චිත්‍රයෙන් පෙනෙයි. සැමදෙසින්ම පරීක්ෂා කරනු ලද මුත් යේසුස්වහන්සේ තුළින් අතිශයින් ජයගත් හෙතෙම, ස්ථිරව අවසානය දක්වා සිටියි! ඔහු ක්‍රිස්තියානි ජීවිතයේ තරඟෙට ඇතුළු වූවා පමණක් නොව, පසුනොබසිනා වීර්යයෙන්ද, ඉවසීමෙන් දුවමින්ද වම හෝ දකුණ නොබලා ඇදහිල්ලේ කර්තෘ හා සම්පූර්ණ කරන්නාවූ යේසුස්වහන්සේ දෙස පමණක් බලමින් සිටින්නේය. (හෙබ්‍රෙව් 12:1—2)

විශ්වාසයෙන් පිරුණු ඒ සිත, යක්ෂයා තම සේනාවන් විසින් වටලමින්, දෙවියන්වහන්සේගේ දරුවා නොමග යවන පිණිස නිෂ්ඵලව වෑයම් කරයි. උඩඟුකමද, මුදලට ඇති ආලයද, දුශ්ශීල භාවයද, යක්ෂයාද, අන් අයද මෙහි වෙති. බොහෝ විට පාපය අන් ස්වරූපයක් ගෙන, වෙනත් වස්ත්‍රයක් හෝ නමක් තුළ සැඟවී එන බැවින්, දූන් මෙහි දිවියා වෙනුවට බූරුවෙක් සිටියි. දේව වචනය හා සත්‍යයේ ආත්මය සියලු සැබෑවට මග පෙන්වන බැවින්, ආගම නැමති වස්ත්‍රය පැළඳ, ආලෝකයේ දූතයෙක් මෙන් පාපය පැමිණියත් අවදිව සිටින ක්‍රිස්තියානිකරු මෙය අඳුනයි. මත්පැන් වීදුරුවක් ගත් එක් මිනිසෙකු ක්‍රිස්තියානිකරු වටේ නටමින්, ලෞකික විනෝදවලින් ඔහුව පාපයට දැමීමට තැත් කරයි. නමුත් පාපය හා ලෝකය යේසුස්වහන්සේ තුළ ඇණගසා කැපවූ ඒ ක්‍රිස්තියානිකරු පාපයට නොවැටෙයි. මෙහි සිටින දෙවන මිනිසා ඔහුට කිනිස්සකින් අනියි. මෙය, නැති තැන නපුර කථා කිරීම, සරදම් කිරීම හා දෙවියන්වහන්සේගේ සතුරන් තුළින් තර්ජනය කිරීමය. බොහෝ විට ඇදහිලිවන්තයන් මෙන් නම දරන මොවුහු සැබෑවූ ඇදහිලිවන්තයාගේ සිතට නොකඩවා අනිති. නමුත් ඔහු එම වදන් නොසළකා දෙවියන්වහන්සේගේ වචන යට ස්ථිරව සිටියි. මෙහිදී ඔහුට යේසුස්වහන්සේගේ වචන මතක් වෙයි: **''මනුෂ්‍යයන් මා නිසා නුඹලාට නින්ද පීඩාකර, නුඹලාට විරුද්ධව සියලු ආකාර අගුණ බොරුවෙන් කියන කළ, නුඹලා ආශිර්වාද ලද්දෝය. ප්‍රීති වෙන්න; ඉතා සන්තෝෂ වෙන්න; මක්නිසාද ස්වර්ගයෙහි නුඹලාගේ විපාක මහත්ය.''** (මතෙව් 5:11—12)

පාපය, මාංසය සහ යක්ෂයා, ක්‍රිස්තියානිකරුව දෙවියන්වහන්සේගෙන් ඈත් කිරීමට නොකඩවා වෑයම් කරයි. නමුත් බලවත් ප්‍රීතිය සමාදනය හා විශ්වාසය නිසා ඔහුට සැබෑ ලෙස මෙසේ කීමට හැකිය: ''ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමයෙන් අප


වෙන් කරන්නේ කවුද? විපතවත්, සිත් වේදනාවවත්, කඩුවවත්, අප වෙන් කරන්නේද? (රෝම 8:35). අපට ප්‍රේම කළ තැනැන්වහන්සේ තුළින් අපි මේ සියල්ලේදී අතිශයින් ජය ගත්තෝ වෙමුව.'' (රෝම 8:37). දෙවියන්වහන්සේගේ සම්පූර්ණ යුධ ඇඳුම පැළඳගත් ඔහු, යේසුස්වහන්සේ තුළින් සියලු බාධ පරීක්ෂාවලින් ජයගෙන, නපුරු දවස්වලදී නොවැටී සිටියි. යේසුස්වහන්සේ තුළින් ජයගත් කල්හි අපටද තේජසේ ඔටුන්න පැළඳ ගැනීමට හැකිවෙයි.

තරුව නැමති හෘද සාක්ෂිය පිරිසිදුව ආලෝකමත්ව ඇති අතර සිත ඇදහිල්ලෙන් පූර්ණ වී, ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පිරී ඇත. අන්තිමය දක්වා ජයගත් අයට දෙවියන්වහන්සේගේ පොරොන්දු දේවදූතයා නැමති දේව වචනය මතක්කර දෙයි. ''ජය-ගන්නාට දෙවියන්වහන්සේගේ පාරාදීසයෙහි තිබෙන ජීවන වෘක්ෂ-යෙන් කන්ට දෙන්නෙමි.'' ''ජයගන්නාට දෙවන මරණයෙන් අනතුරු නොවන්නේය.'' ''ජයගන්නාට සැඟවී තිබෙන මන්නා-වලින් දෙන්නෙමි; ලබන්නා මිස, වෙන කිසිවෙක් නොදන්න අළුත් නාමයක් ලියා තිබෙන සුදු ගලක්ද ඔහුට දෙන්නෙමි.'' ''ජය ගත්-තාවූ, කෙළවර දක්වා මාගේ ක්‍රියා පවත්වන්නාවූ තැනැත්තාට මාගේ පියාණන්වහන්සේගෙන් මා ලැබූ ලෙස ජාතීන් කෙරෙහි බලය දෙන්නෙමි.'' ''ජයගන්නා මෙසේ සුදු වස්ත්‍රයෙන් පළඳවනු ලැබේ. ඔහුගේ නම ජීවන පොතෙන් මකා නොහැර, මාගේ පියා-ණන්වහන්සේද, උන්වහන්සේගේ දූතයන්ද ඉදිරියෙහි ඔහුගේ නාමය පිළිගන්නෙමි.'' ''ජයගන්නා මාගේ දෙවියන්වහන්සේගේ මාළිගාවේ කණුවක් කරන්නෙමි. ඔහු තවත් එතැනින් පිටතට නොයන්නේය.'' ''මම ජයගෙන මාගේ පියාණන්වහන්සේ සමග උන්වහන්සේගේ සිංහාසනයෙහි හිඳගත් සේම, ජයගන්නාටත් මාගේ සිංහාසනයෙහි මා සමග ඉඳගන්ට දෙන්නෙමි.'' (එළිදරව් 2:7, 11, 17, 26; 3:5, 12, 21).

විවෘත වූ මුදල් පසුම්බිය පෙන්වනුයේ, ඔහුගේ සිත පමණක් නොව මුදල්ද දෙවියන්වහන්සේට කැපකර තිබෙන බවයි. ලෞකික දෙය නාස්ති නොකර, සෑමදෙයම දෙවියන්වහන්සේගේ ගෞරවයට පාවිච්චිකර, දුප්පතුන්ට උදව් කරමින් දහයෙන් කොටසද, සම්මාදමද ඔහුට අයිති සියල්ලද විවෘත වූ ප්‍රීතිමත් සිතකින් ඔහු දෙවියන් වහන්සේට පිරිනමයි.

පාන්ගෙඩිය හා මත්ස්‍යයා පෙන්වනුයේ, ඔහු පිරිසිදු හා මධ්‍යස්ථ ජීවිතයක් ගත කරන බවයි. මත්පැනින් හා ලේ බීමෙන්ද, බෙල්ල මිරිකූ දෙයින් හා වෙනත් අපිරිසිදු කෑමෙන්ද ඔහු කිලිටි නොවී තම මුදල්ද නාස්ති නොකරයි. තවද බුලත් හැපීමෙන් හා නොයෙක්

ආකාරයේ දුම්බීමෙන්ද, මත් ද්‍රව්‍යයෙන් හා හානිකර බෙහෙතින්ද දෙවියන්වහන්සේගේ ගෘහය වන තම ශරීරය කිලිටි නොකර, ශක්තිය ගෙනදෙන සැපදයක, පිරිසිදු, ආහාර පමණක් අනුභව කරයි.




## 9. ජය ගත්තාවූ සිත

දැන් ඔහුගේ සිත යාඥවේ නිවසක් වී සෑම දේශගුණයක් යටතේ හා ඕනෑම සිද්ධියකදී වුවද ගරු කරමින් දේවස්ථානයට නොකඩවා යයි. ක්‍රිස්තියානිකරුවෙකුට දෙවියන්වහන්සේ සමග යාඥවෙන් ඇති

සහභාගිකම නොමැතිව ජීවත්වීමට බැරි බව දන්නා ඔහු, යාඥා ගෘහයකදී වුවද, තම පවුලේ අය සමග වුවද, තම පුද්ගලික කාමරයේ වුවද, යාඥාවට ප්‍රිය කරයි.

විවෘත පොත පෙන්වනුයේ බයිබලය ඔහුට විවෘත වූ පොතක් බවය. දිනපතා එය ඉගෙන ගනිමින්, ඥානය හා ශක්තියද, ජීවනය හා ආලෝකයද, ඔහු නොදන්නා සාරවත් වස්තූන්ද සොයාගනියි. බයිබලය ඔහුගේ පාදයන්ට පහනකි—සතුරා පරදවන කඩුවකි; ආත්මයට දිනපතා ලැබෙන ආහාරයකි–පිපාසය සංසිඳවන රසැති වතුරකි; පවිත්‍ර කරන නෑමකි-ඔහුවම පෙනෙන කැඩපතකි. තවද, කුරුසියක් නොමැතිව ඔටුන්නක් නැති බව දන්නා ඔහු, කුරුසිය රැගෙන යාමට ප්‍රිය කරයි. ක්‍රිස්තුස්වහන්සේ සමග නව ජීවයකට නැවත නැගිට ඇති බව දන්නා ඔහු, සදාකාලික, නොපෙනෙන ස්වර්ගීය දෙය සොයයි. ජලය ආසන්න පැල කළ ගසක් මෙන් නිසි කළ ඵල දරයි–සැබෑ මිදි වැලක අත්තක් මෙන් බොහෝ ඵල දරයි. ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් ලැබූ, සියල්ලෙන් පූර්ණ වූ දෙවි-යන්වහන්සේගේ ප්‍රේමයෙන් ඔහුගේ සිත පිරී ඇත. දැන් ඔහු මරණ භය නාඳුනයි! ඔබ?

## දහවන චිත්‍රය

යේසුස්වහන්සේ: "නැවත නැගිටීමද, ජීවනයද මමය. මා කෙරෙහි අදහාගන්නා මළ නුමුත් ජීවත් වන්නේය. ජීවත්ව සිටින කවුරු නමුත් මා කෙරෙහි අදහාගන්නේද ඔහු කිසි කලෙකත් නොනසින්නේය" (යොහන් 11:25–26). "මාගේ වචනය අසා, මා එවූ තැනැන්වහන්සේ අදහාගන්නාට සදාකාල ජීවනය තිබේ. ඔහු විනිශ්චයට පත් නොවී, මරණයෙන් ජීවනයට පත්ව සිටියි" කීසේක (යොහන් 5:24). මරණ බිය හෝ වධ විඳිම ක්‍රිස්තු භක්තිකයාට නොමැත. "මරණය ජයෙන් ගිලිනා ලද්දේය. එම්බා මරණය, තාගේ ජය කොහේද? එම්බා මරණය, තාගෙ කටුව කොහේද? අපගේ ස්වාමිවූ යේසුස්වහන්සේ තුළින් අපට ජය දෙන්නාවූ දෙවියන්වහන්සේට ස්තුති වේවා. (1 කොරින්ති 15: 54–57)

දෙවියන්වහන්සේ සමග ජීවත්වෙමින් සිටින තැනැත්තාට මරණ භයක් නොමැත. වෙන්වීමේ දවස ආ විට, ඔහු ඉතාමත් ප්‍රීතියෙන් සමු ගනියි. "මාගේ ආසාව නම් තුරන්ව ගොස් යේසුස්වහන්සේ සමග විසීමය. මක්නිසාද එය බොහෝ සෙයින් වඩා හොඳය" කියා අපෝස්තලු පාවුල් කියයි (පිලිප්පි 1:23).

Copyright ANGP

අප වෙනුවෙන් රුදු කුරුසිය මත දිවි පුද අපට ගැලවීම ගෙන දුන් යේසුස්වහන්සේගේ මුහුණ දැක්මට සූදනමින් සිටින ක්‍රිස්තුභක්ති-කයාට උන්වහන්සේගේ මෙම වචන ශුද්ධාත්මයාණන්වහන්සේ




## 10. ප්‍රශංසනීය සදකාල ජීවිතයට ඇතුළුවීම

මතක්කර දෙති: නුඹලාගේ සිත් නොකැළඹෙත්වා ! ‘‘දෙවියන්-වහන්සේ කෙරෙහි විශ්වාස කරන්න; මා කෙරෙහිත් විශ්වාස කරන්න. මා පියාණන්වහන්සේගේ ගෘහයේ බොහෝ වාසස්ථාන ඇත්තේය.

මා සිටින ස්ථානයේ නුඹලාත් සිටින පිණිස මම නැවත ඇවිත්, නුඹලා මා ළඟට ගන්නෙමි'' (යොහන් 14:1–4). ''දෙවියන්වහන්සේ උන්වහන්සේට ප්‍රේම කරන්නන්ට සූදනම් කළ යම් දෙයක් ඇද්ද, ඒ දෙය ඇසට නොපෙනුනේය; කනට නොඇසුණේය, මිනිස් සිතට නොපැමිණුනේය'' (1 කොරින්ති 2:9). ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්–වහන්සේගේ මාවතේ ගමන් කරන අයට සූදනම්කර තිබෙන ස්වර්ගික තේජස තෝරා දීමට හෝ විස්තර කරලීමට මෙලොව කිසිම භාෂාවක් නොමැත.

භයංකාර ඇටසැකිල්ල (මරණය) වෙනුවට දෙවියන්වහන්–සේගේ දූතයා නැතහොත් පණිවුඩකරු මෙහි පැමිණ නිදහස් වූ ආත්මය දෙවියන්වහන්සේ වෙත ගෙන යෑමට බලා සිටියි. මෙ–ලොවදී උන්වහන්සේ වෙනුවෙන් ජීවත්ව, මරණින් පසු, මරණීය ශරීරයට බැඳ තිබූ ඔහුගේ ආත්මය හා ප්‍රාණය නිදහස් වී, එම ආත්මය ප්‍රේම කළ දෙවියන්වහන්සේගේ තුරුළට විවෘතවූ ස්වර්ගීය දොරටුවලින් ඇතුළු වෙයි. දෙවියන්වහන්සේ ඉදිරිපිට ඔහුට ප්‍රීතිමත් පිළිගැනීමක් සූදනම්කර, මෙම ප්‍රසංසනීය වදනින් ඔහුගේ ස්වාමියා හා ගුරුතුමා සුබ පතයි: ''යහපත්වූ, විශ්වාසවූ දසය, නුඹේ ස්වාමියාගේ ප්‍රීතියට ඇතුල්වෙන්න'' (මතෙව් 25:21). ස්වාමින්ගේ ශුද්ධවන්තයන්ගේ මරණය උන්වහන්සේ ඉදිරිපිට අනර්ඝය'' (ගීතාවලිය 116:15). මේ නිසා ඔහු කෙරෙහි යක්ෂයාට කිසිම බලයක් නොමැත. ''තවද මෙතැන් සිට ස්වාමින්වහන්සේ තුළ නසින්නාවූ මළවුන් වාසනාවන්තයෝය කියා ලියන්නැයි ස්වර්ගයෙන් හඬක් මට ඇසුණේය. එසේය, ඔව්හු තමුන්ගේ වෙහෙසීමෙන් නිවාඩු ලබති. ඔවුන්ගේ ක්‍රියාද ඔවුන් කැටුව යන්නේය'' (එළිදරව් 14:13).

# අවසාන අවවාදය

ප්‍රිය මිතුර, ඔබට ප්‍රේම කරන දෙවියන්වහන්සේට ඔබේ සිත අවංකව දීමට උන්වහන්සේ උදව් කරනසේක්වා! ''මාගේ පුත්‍රය, දුව, නුඹේ සිත මට දෙන්න'' (හිතෝපදේශ 23:26) කියා උන්වහන්සේ මෙම මොහොතේදී ඔබට බැගෑපත් ලෙස කන්නලව් කරති. විඩාවට පත්වී, බලාපොරොත්තු බිඳී, වේදනාවෙන් පිරුණු ඔබ සිත යේසුස් වහන්සේට පිළිගන්වන්න. එවිට උන්වහන්සේ ඔබට අළුත් සිතක් සහ අළුත් ආත්මයක් දෙනසේක. සිතේ තෘෂ්ණාවන් අනුගමනය කිරීමට ඔබගේ රැවටිලිකාර සිතින් රැවටෙන්න එපා! එමන්ද ''තමාගේම සිත කෙරෙහි විශ්වාසය තබන්නා අඥනයෙක්ය. එහෙත් නුවණින් හැසිරෙන්නා ගැළවෙන්නේය'' (හිතෝපදේශ



Copyright ANCP

28:26). ඔබගේ පාප අත්හැර ධර්මිෂ්ඨකමට ඇලුම් කරන්න. ‘‘පාපයේ කුලිය නම් මරණයයි. නමුත් දෙවියන්වහන්සේගේ දීමනාව නම් අපගේ ස්වාමිවූ යේසුස්වහන්සේ තුළ සදාකාලික ජීවනයයි’’ (රෝම 6:23).

දෙවියන්වහන්සේට තම ජීවිතය කැප කළ අය, ‘‘සාරවූ වචනවල ආදර්ශය, ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇති ඇදහිල්ලෙන් හා ප්‍රේමයෙන් අල්ලාගෙන සිටිති.’’ මේ කාරණාව උදෙසාම පාවුල්තුමා 2 තිමෝති 1:12 හි මෙසේ පවසයි: ‘‘මක්නිසාද මා විසින් අදහාගත් තැනැන්වහන්සේ කවුද කියා මා දැනගෙන, මා උන්-වහන්සේට භාරදී තිබෙන දේ ඒ දවස දක්වා ප්‍රවේසම් කරන්ට උන්වහන්සේ පොහොසත් බව විශ්වාසකර සිටිමි.’’ ඉතාමත් ශුද්ධවූ ඇදහිල්ලකින් තමාව ගොඩනගා ගෙන ශුද්ධාත්මයාණන්වහන්සේ තුළින් යාඥා කරන්න. මාර්ගයද, සැබෑවද, ජීවනයද වන යේසුස් වහන්සේ දෙස බලමින්, ඔබ දෙවියන්වහන්සේගේ ප්‍රේමයේ ජීවත්වන්න. තමන් වෙතට තම දරුවන් ගැනීම පිණිස, අප ස්වාමින්වහන්සේ විගස එනසේක. උන්වහන්සේ ‘‘රජුන්ගේ රජ හා ස්වාමින්ගේ ස්වාමින්ය’’

‘‘ඉතින් නුඹලා නොපැකිළෙන ලෙස ආරක්ෂා කරන්ටත්, මහත් ප්‍රීතියෙන් යුක්තව උන්වහන්සේගේ තේජස ඉදිරියෙහි කැලැල් රහි-තව තබන්ටත් සමර්ථවූ, අපගේ ගැලවුම්කාර එකම දෙවියන් වහන්සේට අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් ගෞරව යද, මහත්තත්වයද, පරාක්‍රමයද, බලයද සියලු කාලවලට ප්‍රථමයෙන් සහ දැනටත් සදාකාලයටත් වේවා. ආමෙන්.’’ (යුදස් 24, 25).

Copyright ANGP

**A SPECIAL WORD FROM ANGP**

**UN MONDE SPÉCIAL DE L'ANGP**

**UMA PALAVRA ESPECIAL DA ANGP**

**This booklet "The Heart of Man" is available in over 538 languages and dialects spoken throughout the world (Africa, Asia, The Far East, South America, Europe, etc.) Our Heart Book is now also available on cell phones, tablets, etc from www.angp-hb.co.za or as an APP "Heart of Man" on Android phones.**

**Le livre du "Coeur de l'homme" peut etre obtenu en plus de 538 langues et dialectes parles dans le monde entier, a savoir: Afrique, Amerique, Asie, Extreme Orient, Europe. Notre Livre du Coeur est maintenant aussi disponible sur votre Telephone cellular, plaques, etc. de www.angp-hb.co.za ou comme une Application "Heart of Man" sur telephones Android.**

**Este livro "O Coracao do Homem" e obtido em mais de 538 linguas e dialectos falados em todo o mundo, a saber: (Africa, Asia, America do Sul, Extremo Oriente, Europa, etc). O nosso Livro O Coração do Homem tambem esta agora disponivel em telefone celular, tablets, etc. de www.angp-hb.co.za ou como um aplicativo "Heart of Man" nos telephones celulares Android.**

**The 10 heart pictures contained in this booklet are also available in the form of large coloured picture charts (86 x 61cm) bound together in a set of 10 pictures. These "Heart Charts" can be obtained with European or African features and are particularly suitable to be used in conjunction with the Heart Book for class-teaching, open air evangelization etc. Kindly contact us to ascertain the latest subsidized price of this chart.**

**Les 10 images du coeur qui figurent dans ce livre peuvent etre obtenues en tableaux de couleur, format 86 x 61 cm, avec des physionomies europeennes ou africaines. Ils peuvent etre utilises en meme temps que le livre du coeur pour des classes bibliques, a**

Copyright ANGP

l'ecole du dimanche ou lors de reunions de plein air. Soyez aimable de nous contacter pour assurer les derniers prix en cours du tableau.

As 10 imagens do coracao, contidas neste livro podem ser obtidas num conjunto de 10 imagens em colorido no tamanho de (86 x 61 cm). Estes "Cartazes do Coracao podem ser obtfdos com caracterfsticas Europeias e Africanas e podem ser usados em conjuncao com o mesmo livro em classes de ensino biblico, evangelizacao ou ao ar livre. Agradeciamos que nos contacta- se para confirmacao do ultimo preco dos cartazes.



Kindly write to us if you are able to assist us with further translations of our free Gospel literature, informing us of the language into which you could translate this Gospel literature. Your assistance would be appreciated.

Copyright ANGP

If you have found salvation in Christ, or have been otherwise blessed through our Gospel literature, please let us know. We would like to thank God with you, and remember you further in our prayers.

Nous vous invitons a nous contacter pour faire des arrangements concernant de nouvelles traductions de notre litterature, nous informant de la langue dans laquelle vous pouvez traduire cette litterature evangelique. Votre aide sera beaucoup appreciee.

Si vous avez trouve le salut en Christ ou si vous avez ete beni par notre litterature, nous vous prions de nous le faire savoir. Nous aimerions remercier Dieu avec vous et prier pour vous.

Nos vos convidamos a nos contactar, afim de fazer qualquer arranjo concernente a novas traducoes de nossa literatura em outras Ifnguas. Vossa assistencia sera muito apreciavel.

Se tem encontrado a salvacao em Cristo, ou se tem sido abencoado por intermedio da nossa literatura evangelica, faca o favor de nos

informar. Pois nos gostarfamos de agradecer a Deus juntamente convosco, e lembra-lo sempre em nossas oracoes.

For free Gospel literature, books and tracts in over 538 languages, write to:

Pour obtenir gratuitement de la litterature evangelique, des livres et des traites en plus de 538 langues, ecrivez a:

Para obter gratuftamente a literatura evangelica, livros e folhetos em mais de 538 Ifnguas diferentes escreva para:

E-MAIL: info@angp-hb.co.za
info@angp.co.za

**ALL NATIONS GOSPEL PUBLISHERS**
**P.O. Box 2191**
**PRETORIA**
**0001**
**R.S.A.**

Copyright ANGP

A Gospel Literature Mission financed by donations
Une Mission de litterature evangelique financee de dons
Missao de literatura Evanqelica financiada por donativos

(Reg. No. 1961/001798/08)